# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,894 — 1970 පෙබරවාරි 20 වැනි සිකුරාදා — 1970.2.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 243 | කොටුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 261 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 264 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 281 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 282 | විවිධ දැන්වීම් ... ... ... ... | 282 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යනා මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත් වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත් නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ සනීපයෙන් යුක්ත බව,

(බී) 1970.3.9 වැනි දිනට වයස අවුරුදු 35 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි වී යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(සී) ජ්‍යෙෂ්ඨ/අ.පො.ස. විභාගයේ දී හෝ වෙනත් උසස් විභාගයකදී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍ර වලින් සමර්ථ විය යුතුයි.

(ඩී) (i) ප්‍රධාන අධ්‍යාපන නිලධාරියෙකු වශයෙන් අවුරුදු 3 කට නො අඩු සේවයක් හෝ අධ්‍යාපන උපදේශකවරයෙකු වශයෙන් අවුරුදු 5 කට නො අඩු සේවයක් ඇත්තෙකු, හෝ

(ii) 12,480 කට නො අඩු වාර්ෂික වැටුපක් ලබන්නා වූ උපරිම වාර්ෂික වැටුප රු. 16,320 කට නො අඩු වැටුප් ක්‍රමයක් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවක හෝ විශ්ව විද්‍යාල වැනි ආයතනයක තනතුරක් දරන්නෙක් විය යුතුයි.

(ඊ) නිදහස් නො කරන ලද්දෙක් නම් අධ්‍යාපන නීති හා රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත් වී සිටිය යුතුයි.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාතර්මේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. එසේනමුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එව්විය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීමට පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
**රාජ්‍ය සේවා කොමිෂන්** සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

2–815/1—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ බී 13/එක්ස් 2203/70

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### සහකාර ලේඛනාරක්ෂක තනතුරු

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍ර යන්හිවූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

**(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 9 වැනිදා**

**(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 13 වැනිදා**

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිළිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම් කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව කරනු ලැබේ.

**(1) ආධුනික කාලය තුලදී නිලධාරියා විසින් ලේඛන පරිපාලනය පිළිබඳ පුහුණුවක්ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරනු ලබන පරිදි 17 වන ශත වර්ෂයේ ඕලන්ද භාෂාව හෝ මධ්‍ය කාලීන පෘතුගීසි භාෂාව පිළිබඳ දැනීමක්ද ලබා ගත යුතුය.**

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

වර්ෂයකට රු. 6,720 න් පටන්ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12ක් මගින් රු. 11,040 ක වාර්ෂික වැටුප තෙක් වැඩිවෙන වැටුප් ක්‍රමයකි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970. 3. 9 දිනට වයස අවුරුදු 30 කට නොවැඩි බව. (රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව අදාල නොවේ.) ;

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය, භාෂා හෝ නීතිය පිළිබඳ විෂයයන්ගෙන් පළමුවැනි පෙළ හෝ දෙවෙනි පෙළ ගෞරව උපාධියක් ලබා සිටින්නෙකු බව ;

(ඩී) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා ප්‍රවීනත්වයක් ලබා ඇති බව.

**සටහන :**

(අ) සිංහල හෝ දෙමළ පිළිබඳ හොඳ දැනීමක් හා පෘතුගීසි හෝ ලන්දේසි භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උප්පැන්න සහතිකය වෙනුවට ප්‍රතිඥා ප්‍රකාශ ... — see note) 

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. (i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධයෙන් අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර වෙනත් දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව හෝ එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුයි. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තමන්ගේ ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුයි. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 1, ගාළු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

2–815/2—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 8/එක්ස්. 2204/70

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### සහකාර ගගන නාවික පරීක්‍ෂක I වෙනි ශ්‍රේණිය තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ගගන නාවික පරීක්ෂක I වෙනි ශ්‍රේණිය තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ—1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 9 වැනි ද,

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 13 වැනි ද,

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම් කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන් ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයකු ඉදිරිපිටදී පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු තෙවර්ෂයක කාලසීමාවක් ආධුනිකත්වයෙහි සිටිය යුතුය. ඔහු විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

**ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—රු. 7,800 න් පටන් ගෙන රු. 360 බැගින් වන වාර්ෂික වර්ධකයන් 3 කින් වර්‍ෂයකට රු. 8,880 දක්වා නගින්නකි. ඉන් පසුව, කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයකින් සමත්වූ විටදී, නිලධාරියා වර්ෂයකට රු. 9,600 න් පටන් ගෙන රු. 360 බැගින් වන වාර්ෂික වර්ධකයන් 4 කින් හා රු. 480 බැගින් වන වාර්ෂික වර්ධකයන් 5 කින් රු. 13,440 දක්වා නගින වැටුප් ක්‍රමයක් මත තබනු ලැබිය හැකිය.

1969.10.1 වැනි දිනට පෙර මීට අනුරූප මූලික වැටුප් ක්‍රමය මෙසේ ය :—

රු. 5,160—3×360—6,240/6,960—4×360 සහ 5×480 රු. 10,800.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1970.3.9 වැනි දිනට වයසින් අවුරුදු 23 කට නොඅඩු අවුරුදු 40 කට නොවැඩි බව. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවනු ඇත.

(සී) (අ) (i) දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය හා භෞතික විද්‍යාව ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය)

(ii) ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට උසස් අධ්‍යාපනික සුදුසුකමක්.

(ආ) ගුවන් යානා හා ඇන්ජින් නඩත්තුව පිළිබඳ අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක්.

(ඇ) මුලු පැටවුම් බර රාත්. 30,000 කට නොඅඩු වන ගුවන් යානා සඳහා "අ" කාණ්ඩයෙහි සහ බලවර්ධිත ගුවන් යානා ඇන්ජින් සඳහා "ඇ" කාණ්ඩයෙහි සටහන් ඇතුලත් ප්‍රවර්තන ගුවන් යානා ඉංජිනේරු බලපත්‍රයක් නැතහොත් දෙපාර්තමේන්තුවේ 11 වන ශ්‍රේණියේ සහකාර ගගන නාවික පරීක්ෂකයෙකු වශයෙන් අවුරුදු 8 ක පළපුරුද්දක්.

(ඇ) සියලුම විශේෂයන්ට අයත් ගුවන් යානා සහ ඇන්ජිනුත් ඒවායේ උපාංගයන් හා උපකරණයන් පිළිබඳව මනා දැනුමක්.

(ඉ) ගුවන් යානාවන්හි ගුවන් යෝග්‍යතාව සහ පරීක්ෂණ නියමයන්ට අදාල වන කාර්ය පරිපාටින් හා ව්‍යවහාර යන් පිළිබඳව මනා දැනුමක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම පේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. :—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. :—

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 13 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ල,
තැ. පෙ. 500,
කොළඹ 1.

2–815/3—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී/64/එක්ස් 2205/69

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### සමාජ විද්‍යාඥ තනතුර

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමාජ විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1970 මාර්තු මස 9 වැනිදා.

(බී) විදේශ ඉල්ලුම්පත්—1970 මාර්තු මස 13 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම විදේශ යන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවර යෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම අවුරුදු 3ක කාලයක පරීක්ෂණයකට යටත් වෙයි.

3. මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේයි.—වර්ෂයකට රු. 6,720—12×360 සහ 11×480—16,320. (රු. 13,920 දී දෙවර්ෂයක නැවතීමක් ද, රු. 11,520 හා රු. 14,400 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද වෙයි.)

සටහන :

(i) පශ්චාත් උපාධි සුදුසුකම් ඇති තැනැත්තෙකු පත් කරනු ලැබුව හොත් ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 7,800 ආරම්භක වාර්ෂික වැටුපේ තැබිය හැක.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා නොගත හොත් තෝරාගනු ලබන අපේක්ෂකයාට වර්ෂයකට රු. 11,520 ඉක්මවා යෑමට නොහැක.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970.3.9 වැනි දිනට අවුරුදු 22 ට නොඅඩු බව, පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් දරන්න වුන් අවුරුදු 30 ට නොවැඩි බව හා පිළිගත් පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නවුන් අවුරුදු 35 ට නොවැඩි බව (රාජ්‍ය සේවයේ දැනටමත් තනතුරු උසුලන්නවුන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.) ;

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් හෝ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.) ;

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්.—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහා චාර්ය වරයාගෙන් විය යුතුය ;

(ඞී) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපෙක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවනලද (" ආ " සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යෙ... කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම නමත්... නිකුත් කරන ලද (" අ " සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එ... සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එ... ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත... ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ... ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළ... තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ... අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභා... ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇ... අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේක...

1970 පෙබරවාරි 13 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500.

2–815/4—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 21/එක්ස්. 2207/70.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායඹාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 9 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 13 වැනි ද.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දවූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඹාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කායඹාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිලිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

නව ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—රු. 11,040—7×480—14,400 (1969.10.1 වැනි දිනට පෙර මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 8,400—6×480—රු. 11,280 කි.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.3.9 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු ... අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක පහත සඳහන් විෂයකින් ... උපාධියක් තිබීම :—

(අ) ඉංජිනේරු විද්‍යාවෙන්

(ආ) ගණිතයෙන් හෝ විද්‍යාවෙන්

(ඇ) වාණිජ විද්‍යාවෙන් හෝ

(ඈ) ආර්ථික විද්‍යාවෙන්

(ii) අවුරුදු 5 ක ඉගැන්වීමේ සහ පරිපාලන පළපුරුද්ද සහ සිංහල භාෂාව ගැන හොඳ දැනීමක් තිබී... ඉංජිනේරු විද්‍යාවෙන් හෝ විද්‍යාවෙන් උපා... ලැබූවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වි... ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි ප... උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ... සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ... තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ ... චාර්ය වරයාගෙන් විය යුතුය.

(ඞී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම වි... පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත... හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කි... නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ස... බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්... ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග... ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එ... කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට ... හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැ... සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝ... සමග තමන්ට එවන ලද (" බී " සලකුණ දරන) මුද්‍රිත තැපැල්... මේ සමඟ භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ල... රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙ... මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො ... යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම නමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුන දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායභාලයේ දී ය.
තැ. පෙ. 500.

2–815/5—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකා උසස් කාර්මික, විද්‍යායතනය, කටුබැද්ද, මොරටුව

### II වැනි ශ්‍රෙණියේ සැලසුම් වැඩ පිළිබඳ උපදේශක තනතුර

මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යාතනයේ II වැනි ශ්‍රෙණියේ සැලසුම් වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අයැදුම් කරුවන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන නිදර්ශන ආකෘතිපත්‍රය අනුව පිළියෙලවූ අයැදුම්පත් 1970 මාර්තු 9 දිනට හෝ ඊට පෙර ලේඛනගත තැපැලෙන් මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යාතනයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන්නට එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධරයකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත්කරනු ලැබේ.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය :—

(i) 1970 මාර්තු 9 දිනට වයස අවුරුදු 21ට නොඅඩු අවුරුදු 40ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධරයනට ඉහළ වයස් සීමාව අදල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ;

හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී සිටින බව ;

සහ

(iv) (අ) යාන්ත්‍රික ඇඳීමද විෂයයක් වශයෙන් ඇතුව ගොඩනැගිලි නිර්මාන පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයීය සහතික පත්‍රය ; හෝ

(ආ) යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාල සන්ධ්‍යා සහතිකය ; හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාල කණිෂ්ඨ කාර්මික නිලධරයන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය ; හෝ

(ඈ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය ; හෝ

(ඉ) සමාන හෝ උසස් සුදුසුකම් ;

(v) සිංහලයෙන්/දෙමළයෙන් ඉගැන්වීමේ හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීම ලැබී අවුරුදු 3ක් ඇතුළත සිංහලයෙන්/දෙමළයෙන් ඉගැන්වීමේ ප්‍රවීණතාව ලබාගත යුතුය.

**සටහන.**—පත්කරනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසරකට රු. 6,024ක ස්ථිර වැටුපක් හා වැඩ බැලීමේ පදනමක් මත පත්කරනු ඇත.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 6,024–4 × 144 හා 8 × 180—8,040 වේ. (රු. 6,780 හා රු. 7,500 වාර්ෂික වැටුප ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

5. රජයේ සේවාවේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයැදුම්කරුවන් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව ලැබෙන අයැදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානයාට නියමිත කාලසීමාව තුළ ලැබී ප්‍රමාදය ගැන පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයැදුම් පත් භාර ගනු ලැබේ.

6. අයදුම්කරුවන් පහත දැක්වෙන එක් එක් ලියවිල්ලේ පිටපත බැගින් (මුල්පිටපත් නොවේ) අයැදුම් පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුළුවීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවනට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය බාරගනු නොලැබේ);

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික 3ක් ;

**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවාවේ නියුතු අයැදුම්කරුවන් ඉහත (ඇ) අනුඡෙදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.

7. අයැදුම්පත් හා අනෙකුත් ලියකියවිලි මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යාතනයෙහි අධ්‍යක්ෂගේ නිල නාමයට මිස කිසිම පුද්ගලයකුගේ නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වන කොටසේ දෙවන ඡෙදය ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධව පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහා ඇති ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ ''සැලසුම් වැඩ උපදේශක තනතුර සඳහා අයැදුම් පත'' යන්න සඳහන් කළ යුතුයි.

ඇල්. එච්. සුමනදස,
අධ්‍යක්ෂ,
ලංකා උසස් කාර්මික විද්‍යාතනය.

1970 පෙබරවාරි මස 10 දින,
මොරටුව,
කටුබැද්දේ,
ලංකා උසස් කාර්මික විද්‍යාතනයේ දී ය.

## ඉල්ලුම් පත්‍රය

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය, කටුබැද්ද, මොරටුව

### II වැනි ශ්‍රෙණියේ සැලසුම් වැඩ පිළිබඳ උපදේශක තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුය) :————.

3. ජාතිය : ————.

(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න)

5. උපන් ස්ථානය :

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ/ඇගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

(ආ) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————.

(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙන ගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දින සමග :———.

(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථාකිරීම, හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?

(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

11. විශේෂ සුදුසුකම් (නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානුව සහිතව සඳහන් කරන්න) :————.

12. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් මේ අවශ්‍ය නැත.)

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—

(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර (ආ) සේවයේ යෙදී සිටි දින (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :

(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත් වූ දිනය :————
(ii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද ? :———
(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :———
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුසු සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–734—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/205.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970-71 නෝර්විජියානු රජයේ ශිෂ්‍යත්ව

නෝර්විජියානු රජය විසින් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි අධ්‍යාපනය හෝ පර්යේෂණය සඳහා පිරිනමන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:—

**"අ" වර්ගය**—සියලුම ක්ෂේත්‍රයන් හි පශ්චාත් ආචාර්ය පර්යේෂණ ප්‍රදාන.

**"ආ" වර්ගය**—ඉංජිනේරු විෂයයන් සඳහා උසස් අධ්‍යාපනය/පුහුණුව පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය සඳහා.

**"ඉ" වර්ගය**—පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වෘත්තීය හා කාර්මික පුහුණුව :—

(i) උසස් භූ ගර්භ විද්‍යාව,
(ii) චිකිත්සාගාර කායික ස්නායු විද්‍යාව,
(අ) ඊ. ඊ. ජී.—කාර්මිකඥයින් සඳහා පාඨමාලාව හා
(ආ) වෛද්‍ය වරුන් සඳහා පාඨමාලාව.
(iii) කඩදාසි පල් කිරීම හා කඩදාසි කාර්මික විද්‍යාව.

**සැ. යු.**—ශිෂ්‍යත්ව සංඛ්‍යාව සවල්පයක් වන අතර, කිසිම රටකට නියත වශයෙන් ශිෂ්‍යත්ව ගණනක් වෙන් නොකර, ලෝක ව්‍යාප්ත පදනමක් මත ප්‍රදානය කරනු ලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුඩිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂය 3 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් වර්ෂයක් වන්නේ ය.

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් වීමට නොහැකි වීම නිසා හෝ නෝර්විජියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ii) 1970.9.1 වැනි දිනට, වයස අවුරුදු 25-40 අතර විය යුතුයි.
(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.
(iv) (අ) **අයදුම් කරන්නේ "අ" වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම් :**—පිළිගත් විශ්ව විද්‍යාලයක ආචාර්ය (පී.එච්.ඩී) උපාධියක් ලබා සිටිය යුතුය.

(ආ) **අයදුම් කරන්නේ "ආ" වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම් :**—පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව සඳහා එම්. එස්. සී. උපාධියක් ලබා සිටිය යුතුයි.

(ඉ) **අයදුම් කරන්නේ "ඉ" (i) වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම් :**—පිළිගත් විශ්ව විද්‍යාලයක ආචාර්ය (පී. එච්. ඩී) උපාධියක් ලබා සිටිය යුතුයි.

අංකය. විආ/2/210

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ආසියානු කාර්මික විද්‍යායතනය පිරිනමන ශිෂ්‍යත්ව, තායිලන්තය—1970/71

තායිලන්තයයේ ආසියානු කාර්මික විද්‍යායතනය විසින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා පශ්චාත් උපාධි මට්ටමේ ඉගෙනීම පිණිස පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්‍ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් තුළ යුතුය.

**සංලක්‍ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්‍ෂය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 21 ක් වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ තායිලන්ත බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1970. 9. 1 වැනි දිනට, වයස අවුරුදු 45 ට අඩු විය යුතුයි.

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

(iv) යටත් පිරිසෙයින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්, ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යා වේදී දෙවන පෙළ උපාධියක් තිබිය යුතුයි.

**සංලක්‍ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970. 9. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) බැංකොක් දක්වා යාමට හා ආපසු ඒමට වැය වන අඩුම ගුවන් ගමන් ගාස්තුව හා තායිලන්තයට ඇතුලත්වීමේදී සිදුවන වියදම් සම්බන්ධයෙන් භාත් 500 ක අත්තිකාරම් දීමනාවක්.

(ආ) මසකට භාත් 1,500 ක යැපීම් දීමනාවක්.

(ඉ) නොමිලයේ ඉගැන්වීම.

(ඊ) රසායනාගාර, වෛද්‍ය හා සාමාන්‍ය ගාස්තු.
(භාත් 1=ශත 29 ක් පමණි.)

**සංලක්‍ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතින්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් තායිලන්තය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදි ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් තායිලන්තයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රැකියා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කලහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. යම්කිසි අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970. 3. 5 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සයුංක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාවය සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 12 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

2–776—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකාරසේවය

ලංකා විදේශ දූත මණ්ඩලවල ලිපිකරු තනතුරු සඳහා සාමාන්‍ය ලිපිකාර සේවයේ, සාමාන්‍ය ලිපිකරු පන්තියේ ලිපිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබූ 1969 ජූනි 20 වන දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම හා සම්බන්ධවයි.

එම දැන්වීමේ සඳහන්වූ අවුරුදු 35 වයස් සීමාව ලංකා විදේශ දූත මණ්ඩලයක එක් වාරයක් සේවය කරන ලද සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියේ ලිපිකරුවන් කෙරෙහි බල පාන්නේ නැත.

ඉහත සඳහන් ගැසට් නිවේදනයේ සඳහන් උප ලේඛනයේ පෙන්වා ඇති ආකෘති පත්‍රයේ සඳහන් ආකාරයට අයදුම්පත් පිළියෙළ කර තමා විසින් කලින් සේවය කරනු ලැබූ ලංකා විදේශ දූත මණ්ඩලය හා එහි සේවය කළ කාලය ද සඳහන් කර, 1970 මාර්තු 15 වන දිනට හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශයට ලැබෙනසේ එවිය යුතුය.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය,
කොළඹ—1,
1970 පෙබරවාරි 12 වන දින.

2–824—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## 1969-70 අධ්‍යයන වාරයට අධ්‍යයන නිවාඩු සඳහා වෛද්‍ය නිලධාරීන් තේරීම

මෙහි මතු (1) වන, (3) වන තීරු යටතේ දක්වා ඇති විශේෂිතයන්හි පුහුණුව ලැබ ඒ ඒ සුදුසුකම් ලබනු වස් අධ්‍යයන නිවාඩු දීම සඳහා 1970 මාර්තු 20 වන ද වයස අවුරුදු 40 ට පහළ සිටින්නාවූද, අයදුම් පත් භාරගන්නා අවසාන දිනය වන විට සිය පත්වීම් ස්ථිර කරනු ලැබ සිටින්නාවූද, II වන ශ්‍රෙණියේ වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්, මෙහි මතු (4) වන තීරුවේ දක්වෙන නිසිකම් :—

(i) දැනටමත් දරමින්, හෝ

(ii) 1970 ඔක්තෝබර් 1 වන දට කලින් ලැබෙතැයි සිතිය හැකිව හෝ සිටිය යුතුයි.

| (1) විශේෂිතය | (2) ශිෂ්‍යත්ව ගණන | (3) ලබාගත යුතු සුදුසුකම් | (4) පූර්වාශ්‍ය සුදුසුකම් | (5) ශිෂ්‍යත්වයේ කාලසීමාව |
|---|---|---|---|---|
| 1. පොදු වෛද්‍ය කර්මය ... | 2 ... | එම්.ආර්.සී.පී. (එක්සත් රාජධානිය) | ඇම්ඩී සුදුසුකම තිබෙන නිලධාරීන්ට වැඩි කැමැත්තක් හිමිවේ | අවුරුදු 2 යි |
| 2. පොදු ශල්‍ය කර්මය ... | 2 ... | එෆ්.ආර්.සී.එස්. (ලන්ඩන්) හෝ (එඩින්) | ප්‍රාථමික එෆ් ආර්.සී.එස්. සහ ශල්‍යකර්ම අභ්‍යාසයෙහි මුළු කාලය යෙදවූ දැවුරුද්දක් නිමවීම | අවුරුදු 2 යි |
| 3. නිර්වින්දනය ... | 2 ... | එෆ්.එෆ්.ඒ ආර්.සී.එස්. ... | ප්‍රාථමික එෆ්.එෆ්.ඒ.ආර්.සී.එස්. පිළිගත් රෝහලක අඩු ගණනේ මාස 12ක නිර්වින්දනය හැර, වෙනත් ශායනික නේවාසික පත්වීම් දරා තිබීම—පිළිගත් රෝහලක නිර්වින්දනය පිළිබඳ මුළු කාලය යෙදවූ මාස 15කට නොඅඩු පත්වීම් | අවුරුදු 2 යි |
| 4. ප්‍රසව චිකිත්සා සහ ස්ත්‍රී චිකිත්සා | 1 ... | (අ) ප්‍ර.වි. සහ ස්ත්‍රී චිකිත්සා විෂය යෙහි එෆ්ආර්සීඑස් (එඩින්) සහ/හෝ | (අ) උදෙසා—ප්‍රාථමික එෆ්ආර්සීඑස් සහ ප්‍රසව චිකිත්සා සහ ස්ත්‍රී චිකිත්සා විෂයයෙහි එක් අවුරුදු නේවාසික පත්වීම් නිමවා සිටීම | අවුරුදු 2 යි |
| | | (ආ) එම්.ආර්.සීඕජී (මහා බ්‍රි.) ... | (ආ) උදෙසා— (i) ලේඛ්‍යාරුඪයට පෙර මාස 12ක පත්වීම් (ii) මාස හයක පොදු ශල්‍යකර්ම පත්වීම් (iii) මාස 12ක ප්‍රසව චිකිත්සා පත්වීම් (iv) මාස 12ක ස්ත්‍රී චිකිත්සා පත්වීම් | අවුරුදු 2 යි |
| 5. රක්ත විද්‍යාව ... | 1 ... | එම්.ආර්.සී.පී. (එක්සත් රාජධානිය) | (i) පිළිගත් රෝහලක මාස 12ක නේවාසික පත්වීම් (ii) රුධිරය අන්තර්ගත කිරීමේ සේවයේ දැවුරුද්දක වැඩ | අවුරුදු 2 යි |
| 6. කායික වෛද්‍යකර්මය ... | 1 ... | එම්.ආර්.සී.පී. (එක්සත් රාලධානිය) | ඩීපීඑම් ... ... ... | අවුරුදු 2 යි |
| 7. විකිරණ රෝග විනිශ්චය | 1 ... | ඩීඑම්ආර්ඩී ... ... | (i) (පොදු වෛද්‍ය කර්ම) වාට්ටු නිලධාරියෙකු හෝ (පොදු ශල්‍යකර්ම) වාට්ටු නිලධාරියෙකු හෝ හැටියට පත්වීමක්ද ඇතුළු, පිළිගත් රෝහලක 12 මාසයක රෝහල් නේවාසික (විකිරණ විද්‍යාව හැර) පත්වීම් (ii) විකිරණ විද්‍යාව විෂයයෙහි දැවුරුද්දක වැඩ | අවුරුදු 2 යි |
| 8. විකිරණ රෝග විනිශ්චය | 1 ... | එෆ්.එෆ්.ආර්. ... | (i) ඩීඑම්ආර්ඩී ... ... ... (ii) හය අවුරුද්දක නිපුණත්වය (iii) විකිරණ රෝග විනිශ්චයෙහි මුළු කාලය යෙදවූ 3 අවුරුද්දක පත්වීම් | අවුරුදු 2යි |

2. යම් විශේෂිතයෙක අධ්‍යයන නිවාඩු සඳහා තෝරාගනු ලැබ සිටින අපේක්ෂකයෙකුට, පසුව වෙනත් විශේෂිතයකට මාරු වීමට ඉඩ නොදෙ අතර, අධ්‍යයන නිවාඩුවෙන් පසු පෙරළා පැමිණි විට ඔහු හුදෙක් ඒ විශේෂිතයෙහිම භාවිතා කළ යුතුද වේ. විශේෂඥයින් හැටියට ඔවුන්ට පත්වීම් දෙ ලබන්නේ විශේෂඥයින් සංඛ්‍යාවෙහි ඇබැර්තු තිබේනම් පමණකි. විශේෂඥ සංඛ්‍යාවෙහි ඇබැර්තු නොතිබෙන තුරු, මේ සුදුසුකම් දරණ නිලධාරීන් ශ්‍රෙණි වෛද්‍ය නිලධාරීන් හැටියට දිගටම සැලකෙන අතර, විශේෂඥ දීමනාවටද හිමිකරුවන් නොවනු ඇත.

අධ්‍යයන නිවාඩු දීමට තෝරනු ලබන නිලධාරීන්ට මතු සඳහන් වරප්‍රසාද දෙනු ලැබේ :—

(i) නියමිත කාලසීමාව තුළ මුළු වැටුප,

(ii) රජයේ වියදමෙන් එංගලන්තයට යාමට සහ පෙරළා පැමිණීමට නැව් ගාස්තුව,

(iii) (තමන්ගේ ගුරු පඩුරු හැර) අනුමත අධ්‍යයන සහ අභ්‍යාස පාඨ මාර්ගයේත්, නිලධාරියා ජය ලබන විභාගයේත් සියලු ගාස්තු ගෙවීම,

(iv) නිලධාරියාට දිවයිනෙන් පිට සිටීමට සිදුවන කාලසීමාවට 276 වන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ගෙවීමට තිබෙන දීමනා.

3. මතු සඳහන් කොන්දේසි ගැබ්වූ ගිවිසුමකින් බැඳෙන සේ නිලධාරීන්ට නියම කරනු ඇත :—

(i) නියමිත සුදුසුකම් නියමිත කාලසීමාව තුළ ලබන බවට,

(ii) දිවයිනට පෙරළා පැමිණි පසු අවුරුදු 15ක් රජයට සේවය කරන බවට (සේවයෙන් පහ කරනු ලැබීම සේවය පවත්වාගැනීමට අපොහොසත් වීමක් සේ සැලකේ),

(iii) පෞද්ගලික වෙදකමේ යෙදීමෙන් වැළකී මුළු කාලයම යොදවා සේවය කරන බවට,

(iv) ගිවිසුමේ දක්වෙන කොන්දේසි සතුටුදායක ලෙස ඉටු කළ නොහැකි වුවොත්, රජයේ තීරණය පරිදි නියමිත ගණන් ආපසු ගෙවීමට යටත් බවට.

4. යාන පත්‍ර ගාස්තුවලටත්, මාස්පතා පිටරට යවන මුදල්වලටත් විවිහිස ගෙවිය යුතු බව රජය තීරණය කර තිබේ. එහෙත්, මෙය රජයේ මුදලින් ගෙවනු ලැබේ.

5. ඒ ඒ අභ්‍යාස මධ්‍යස්ථානවල ඉඩකඩ සහ පහසුව ලබාදීමට දෙපාර්තමේන්තුව වෑයම් දරනු ඇත. බ්‍රිතාන්‍යයේ ලංකා මහා කොමසාරිස්තුමා මගින් වැඩ පිළිවෙල යොදනු හැකි වනු වස්, තමන්ගේ අවශ්‍යතාවයන් මා වෙත දන්වන ලෙස තේරී එන නිලධාරීන්ට දන්වා සිටිමි.

6. විශේෂ සැලකිල්ලට හේතු ඇත්නම්, එයද සඳහන් කරමින් තම අයදුම් පත් 1970 මාර්තු 20 වනද නොඉක්මවා මේ කායාීලයට ලැබෙන සේ එවන මෙන් නිලධාරීන්ගෙන් ඉල්ලමි. අයදුම් පත් හැකි තරම් දුරට සියලු කරුණුවලින් සම්පූර්ණ විය යුතුය. අවලංගු සේ සැලකෙන පසුගිය අයදුම් පත් ගැන සඳහන් හෝ ඒවාට සම්බන්ධයක් හෝ මෙහි නොතිබිය යුතුයි. විශේෂිත එකකට වැඩියෙන් ඉල්ලන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම් පත් එවිය යුතුය.

7. අයදුම් පත් ලැබුණු බව දන්වා එවනු ඇත.

ඩී. බී. ගුණසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කායාීලයේ දීය.

2–638—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලයේ පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශයේ VI වෙනි ශ්‍රේණියේ සැළසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන මෙන් ලාංකික පුරවැසියන්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය.**—(සියළු දීමනා ඇතුළුව) මසකට.

රු. 400—රු. 15×7 හා රු. 20×6—රු. 625.

රු. 475 ට හා රු. 525 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩසීම්.

3. **සුදුසුකම්.**—

(i) **වයස.**—1970. 2. 1 වෙනිදාට අවුරුදු 23-45 අතර විය යුතුයි.

(ii) **අධ්‍යයන සුදුසුකම්.**—විෂයයන් 6 කින් එක්වර සමත් වූ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත් විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත් (සාමාන්‍ය) විභාගය හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයක්.

(iii) **වෛෂයික සුදුසුකම්.**—කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨ මාලාව (විදුලි හා යාන්ත්‍රික) සමත් වීම.

හෝ

ලංකා කාර්මික විද්‍යාලයේ 3 අවුරුදු යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම

හෝ

ඊට සමාන විභාගයක්

සහ

සැළසුම් කාර්යාලයක යටත් පිරිසෙයින් 6 මසක් ඇතුළුව, පිළිගත් කර්මාන්ත ශාලාවක අවු වශයෙන් 3 අවුරුදු සේවයක් හෝ පුහුණුවක් ලබා තිබිය යුතුයි.

4. සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා (පත් කිරීමට) තේරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි.**—

තේරුන අපේක්ෂකයින් පළමුවෙනි වතාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුයි :—

(i) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීම.

(ii) දැනටමත් පණවා ඇත්තාවූද කලින් කල පණවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුළදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

(iv) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක් දායකමුදල් ගෙවීම. ඔවුන් වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල් සියයට 15 කි.

(v) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීම.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝර්මය අනුව සකස් කරගත් ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනා ගමන මණ්ඩලයේ, සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1970 මාර්තු මස 13 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන් සෑහෙන ගණනක් තෝරාගත නොහැකි වුවහොත්, ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ගැනත් සලකා බලනු ලැබේ.

ලංකා ගමනා ගමන මණ්ඩලයේ,
සේවක මණ්ඩල කළමනාකාරතැන.

200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.
1970 වේ පෙබරවාරි මස 11 වෙනි දින.

**ආදර්ශ ෆෝර්මය**

## ලංකා ගමනා ගමන මණ්ඩලය

**VI වෙනි ශ්‍රේණියේ සැළසුම්කර තනතුර සඳහා අයදුම්පත යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශය**

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය : (i) පුද්ගලික :————.

 (ii) කාර්යාලීය :————.

3. උපන් දිනය :————.

 (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුනන්න)

4. 1970. 2. 1 වෙනිදාට වයස : අවුරුදු :——, මාස :——, දවස් : ————.

5. ජාතිය :————.

6. ලාංකික පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද, ලියා පදිංචි වීමෙන් ද යන වග :————.

7. විවාහකද, අවිවාහකද යන වග :————.

8. අධ්‍යයන සුදුසුකම් :————.

 (සමත් වූ විෂයයන් දිනයන් සමග දන්වන්න. පිටපත් අමුණන්න.)

9. වෛධික සුදුසුකම් :————.

 (සමත් වූ විභාග, ආයතනයන් හා දිනයන් සමග දන්වන්න— පිටපත් අමුණන්න.)

10. සිංහලෙන් සමත් වූ ඉහළම විභාගය :————.

11. ආධුනිකත්වය :

| සමාගමේ හෝ ආයතනයේ නම | සිට | දක්වා |
|---|---|---|
| .............................. | .......... | .......... |
| .............................. | .......... | .......... |
| .............................. | .......... | .......... |

12. සැළසුම් කාර්යාලයක සේවය/පුහුණුව :————.
 (ආයතනයේ නමත්, සේවයේ/පුහුණුවේ කාලයත් දක්වන්න)

13. පාසැලෙන් අස්වූදා සිට කළ රැකියාවන් :————.

14. දැන් දරණ තනතුර හා පඩිය :————.

15. අයදුම්කරුවා පිළිබඳ තොරතුරු දැනගත හැකි අයගේ නම් හා ලිපිනයන් :—

 1. ..............................................................
 ..............................................................

 2. ..............................................................
 ..............................................................

16. මීට ප්‍රථම ලංගමයේ යම්කිසි තනතුරක් ඉල්ලුම් කළේද ? එසේ නම් එහි ප්‍රතිඵල :————.

17. තමා උසාවියකදී ක්‍රිමිනල් වරදකරුවෙකු වී සිටියේද ? එසේ නම් විස්තර දක්වන්න :————.

මා මෙහි සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මින් සහතික කරමි. යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයාගතහොත් එයින් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව සොයා ගතහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දමනු හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2-804—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ඇබෑර්තු**

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1970 මාර්තු මස 6 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ :

සේවක මණ්ඩල කළමනාකාර තැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලු පාර,
කොළඹ 3.

යන ලිපිනයට ලියාපදිංචි කල තැපෑලෙන් එවිය යුතුය.

3. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවන ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලබන අතර, ඉල්ලුම් පත් ලැබුණු බව ද දන්වනු නොලැබේ.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයක් මත පත් කිරීමට ඉඩ ඇත.

**තනතුර හා වැටුප් පරිමාණය.**—වැද්දුම්කරු සී—3 ශ්‍රේණිය, රු. 180 —260
4×5 : 6×10

**අවශ්‍ය සුදුසුකම් :**

(අ) කියවීමට සහ ලිවීමට හැකිවිය යුතුය.

(ආ) වෘත්තීය සම්බන්ධයෙන් අවුරුදු 8 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) විවිධ වර්ගයේ ඉංජිනේරු අවි ආයුධ භාවිතය පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය.

(ඈ) සේවා ස්ථාන උපකරන පිළිබඳව හොඳ දැනීමක් තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(ඊ) ඛනිජ තෙල් වෘත්තීය ආශ්‍රිතව භාවිත වන අවි ආයුධ සහ ඒවා පාවිච්චි කිරීම පිළිබඳව දැනීමක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

සේවක මණ්ඩල කළමනාකාරතැන.

1970 පෙබරවාරි මස 9 දින,
113, ගාලු පාර,
කොළඹ 3.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|

1. ඉල්ලුම් කරන ලද තනතුර :————,

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

 (පෙලපත් නාමය ප්‍රථමයෙන්)

3. මුල් අකුරු සමග නම :————.

4. ලිපිනය :————.

5. උපන් දිනය :————.

 (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.

7. පුරවැසි භාවය :————.

(උප්පත්තියෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග)

8. විවාහක/අවිවාහක බව : අවිවාහක බව :————, විවාහක බව : ————, දික්කසාද බව :————.

9. අධ්‍යාපනික පසුබිම :—

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේ නම් :————.

11. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :—

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. දනට ලබන වැටුප :————.

13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.

(ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහ කරන්න.)

14. වෙනත් කරුණු :————.

15. මෙම දන්වීමේ තනතුරු සඳහා " අවශ්‍ය සුදුසුකම් " යටතේ සඳහ සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහ හා එය ඔප්පු කිරීම සඳහා අදල සහතිකවල පිටපත් ද අමුණා එ යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහ කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහ සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇ බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දි නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බව ද මම දනිමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–784—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ වූ අයදුම් පත් 1970.3.13 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුර යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුව හොත් ඔහු නියමිත කාලයත් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.**

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරණ සෑම අයදුම්කරුවෙකුම පහත දක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) 1970.3.13 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 40ට නොවැඩි බව, (දනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදල නොවේ.)

(ii) විශිෂ්ය චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) භෞතික විද්‍යාව සහ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයයකින් උපාධියක් ලබා තිබීම.

(iv) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. එසේ නැත්නම් පත්වීමේ දින සිට අවුරුදු 3 ක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගත යුතුය.

සටහන.—ඉගැන්වීමේ පලපුරුද්දක් තිබීම හා/හෝ ඉහත සඳහන් විෂයයන් සහිත රසායන විද්‍යාවත් ඇතුළු උපාධියක් තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

4. (i) මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය:- රු. 6,024—4 × 144—8 × 180—8,040 වේ. රු. 6,780 සහ රු. 7,5 වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවර ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂ කඩඉම්වලින් සමත් විය යුතුය.

(ii) පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වී පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පලපුරුද්දක් ඇ අයකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු විසින් අවශ්‍ය පලපුරුද්ද ලබාගන්න තෙක් රු. 6,024 ක නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුපක් සහිත වැඩ බැලී පදනමක් මත පත් කරණු ඇත.

**සටහන.—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක් පැවැති වැටුප් ක්‍රමය මෙසේය :—රු. 3,420—4 × 120 — 8× 180—5,34 (කාර්යක්ෂමතා කඩඉම් රු. 4,080 සහ රු. 4,800 ට පෙර) වාර්ෂික වැටු ක්‍රමයකි.**

**5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහ සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ.** එසේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැ කිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලු පත් භාර ගනු ලැබේ. තවද සෑම අයදුම් කරුවකුම තම අයදුම් පත්‍ර පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි වල පිටපත් (මු පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය(බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වල ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනු නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගත නො හැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසු පිළිබඳ සහතික 3 ක්,

**(සැළකිය යුතුය.—දනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් වි ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.**

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලිය කියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 13 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.
සාප/3/240.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසිවල සකස් කළ යුතුය) .

**විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුර**

(සැදහුම සාප/3/240.)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) ————. මහතා/මහත්මිය/මෙනෙවිය

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකිකවන්නේ (අ) පරම්පරාවෙන් ද, (ආ) ලියා පදිංචිවීමෙන්ද) යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියා පදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස—.
අවුරුදු :————, මාස :————, දින :————.
(ආ) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය : ————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, විවාහ වූ දිනය සහ ළමයි ගණන සඳහන් කරන්න : ————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙන ගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ ————.
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද ? :————.
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :
(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න:————

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පල පුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේ නම් (අ) දිනය. (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදේ ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේනම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් : (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණ ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :————.
(i) ආයතනවල නම් :————.
(ii) දරණ ලද තනතුර :————.
(iii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iv) අස්වීමට හේතුව :————.
(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :————.
(i) ආයතනයේ නම :————.
(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත් වූ දිනය :————.
(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————
(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය ————.
(ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න.)
(v) මිළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේ ද යන වග : ————.
(සේවය ස්ථිර කර තිබේ නම් එම ලිපියේ පිටපතක් අමුණන්න)

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–816/1—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමග :—

(අ) සිංහල :————

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබා ගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න.:————

11. විශේෂ සුදුසුකම් :————.

(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පල පුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේද ? එසේනම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේනම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත).

16. සේවා මුක්ත භටයෙක් නම්. (අ) සේනාංකය. (ආ) නිලය. (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණ ලද දිනය පිළිබඳ විස්තර :————

17. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :————

(i) ආයතනවල නම් :————.

(ii) දරණ ලද තනතුර :————.

(iii) නියුක්තව සිටි දින වකවානුව :————.

(iv) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) ආයතනයේ නම :————.

(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත් වූ දිනය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.

(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය :—— (ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න)

(v) මීළඟ වැටුප් වැඩි වීමේ දිනය :————.

(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යන වග :—— (සේවය ස්ථිර කර තිබේ නම් එම ලිපියේ පිටපතක් අමුණන්න).

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත් පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,

දිනය :————. අයදුම්කරුගේ අත්සන.

2–816/2—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ස්වයංචල යාන්ත්‍රික පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි ස්වයංචල යාන්ත්‍රික පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ වූ අයදුම්පත් 1970.3.13 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ ස්වයංචල යාන්ත්‍රික පිළිබඳ උප දේශක තනතුර යනුවෙන් සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරණ සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) 1970.3.13 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 40 ට නොවැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව

සහ

(vi) (අ) ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ් ආයතනයේ මෝටර් රථ කර්මාන්ත වැඩ සහතිකය හෝ (ආ) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික විද්‍යායතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය. හෝ (ඇ) හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය හෝ (ඉ) ලංකාවේ කාර්මික අධ්‍යාපන ආයතනයක යාන්ත්‍රික ඉංජිනේරු සන්ධ්‍යා සහතිකය හෝ (ඊ) සමාන හෝ උසස් සහතික, සහ

(v) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. එසේ නැත්නම් පත්වීමේ දින සිට අවුරුදු 3 ක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගත යුතුය.

4. (i) මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. රු. 6,024—4 × 144—8 × 180—8,040 වේ. රු. 6,780 සහ රු. 7,500 වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවර ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩ ඉම්වලින් සමත් විය යුතුය.

(ii) පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පලපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු විසින් අවශ්‍ය පලපුරුද්ද ලබාගන්නා තෙක් රු. 6,024 ක නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුපක් සහිත වැඩ බැලීමේ පදනමක් මත පත් කරණු ඇත.

**සටහන.**—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක්වා පැවැති වැටුප් ක්‍රමය මෙසේය :—රු. 3,420—4 × 120—8 × 180—5,340 (කාර්යක්ෂමතා කඩඉම් රු. 4,080 සහ රු. 4,800 ට පෙර) වාර්ෂික වැටුප් ක්‍රමයකි.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගත නොහැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්.

**සැළකිය යුතුය.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 13 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල සකස් කළයුතුය)

ස්වයංචල යාන්ත්‍රික පිළිබඳ උපදේශක තනතුර

(සැදැහුම/සාප/3/236.)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) මහතා/මහත්මිය/මෙනෙවිය : ————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකිකවන්නේ (අ) පරම්පරාවෙන් ද, (ආ) ලියා පදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියා පදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු ————, මාස ————, දින ————.
(ආ) උපන් දිනය :—
අවුරුද්ද ————. මාසය ————, දිනය :————
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————.
(ආ) විවාහක නම්, විවාහ වූ දිනය : ළමයි ගණන සඳහන් කරන්න : ————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ :
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණකාව
තිබේද ? :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්ත
(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පෑ පුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේනම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදේ ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම
(මේ සහතිකවලපිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————

16. සේවා මුක්ත භටයෙක් නම් : (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණ ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—.
(i) ආයතනවල නම් :————.
(ii) දරණ ලද තනතුර :————.
(iii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iv) අස්වීමට හේතුව :————.
(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටි, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව ා ; ා න් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—.
(i) ආයතනයේ නම :————.
(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියමද ? :————.
(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය: ————.
(ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න.)
(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යන වග :————.
(සේවය ස්ථිර කර තිබේනම් එම ලිපියේ පිටපතක් අමුණන්න.)

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–816/3—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

(283 පිට හා සම්බන්ධයි)

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/8/16 (ජී)

## භාෂණ පරිවර්තකයන් සඳහා විභාගය—1970 අප්‍රේල්

**විභාග දිනය.**—භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට කැමති සාමාන්‍ය ලිපිකරු සේවයේ නිලධාරීන් සඳහා විභාගයක් විභාග කොමසාරිස්වරයා විසින් 1970 අප්‍රේල් 20 වැනි දින සිට කොළඹ දී පවත්වනු ලැබේ.

2. **සුදුසුකම්.**—උසාවිවල භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම් දරණ සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන්, විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සහ සවකීය තානතුරුවල ස්ථිර කරනු ලැබ ඇති භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වේ.

3. **ඉල්ලුම්පත්.**—(i) මේ විභාගයට ඇතුළත්වීමේ ආදර්ශ පෝරම යක් මේ නිවේදනයට යා කොට ඇත. අයදුම්කරුවන් විසින් බාග ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසියක තම අයදුම්පත් පිළියෙළ කළ යුතුය. (මේ සඳහා වෙන් අන් ප්‍රමාණයක කඩදාසි පාවිච්චි නො කළ යුතු යි).

(ii) අයදුම්පත් නිවැරදිවද, පැහැදිලිවද, අපේක්ෂකයාගේ අත් අකුරින් ම සම්පූර්ණ කොට 1970 මාර්තු 14 වැනිදා හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙන්, ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය. අයදුම්පත් පෝර්මයේ අගට යොදා ඇති අන්දමේ සහතිකයක් දෙපාතීමේන්තු ප්‍රධානයන් විසින් දිය යුතු ය. නියමිත දිනයට පසුව ලැබෙන කවර අයදුම්පතක් හෝ ප්‍රතික්ෂෙප කරනු ලැබේ. පෝර්මය බහා එවන ලියුම් කවරය මුදුනේ වම් කෙළ වරෙහි විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතු ය. මේ ක්‍රියා පිළිවෙළ අනුගමනය නො කරන සියලුම අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(iii) 1970 මාර්තු 14 වැනි දිනයට හෝ ඊට පෙර හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන්නට කියන ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ.

4. **නිවාඩු, බටා සහ ගමන් වියදම්.**—විභාග කොමසාරිස් විසින් පිළිගත් ඉල්ලුම්පත්‍ර යවන ලද නිලධාරීන්ට එම පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය.

පරීක්ෂණයේදී පහත සඳහන් අඩු ම ලකුණු ප්‍රමාණයන් ලබා ගන්නා පිට පළාත්වල අයදුම්කරුවන්ට බටා සහ ගමන් වියදම් ගෙවනු ලැබේ :—

ඉංග්‍රීසි භාෂාවෙන් සියයට 30 ක්,<br>
සිංහල භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්,<br>
දෙමළ භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්.

5. **විභාග පරිපාටිය.**—පරීක්ෂණයේ විෂයයන් සහ එම විෂයයන් ගේ නිර්දේශ පත්‍රිකා පහත දැක්වේ :—

.(**අ—විෂයය)—ඉංග්‍රීසි භාෂාව.**—(පැය දෙකක කාලයකට සීමා වූ ප්‍රශ්න පත්‍රයකි.) අයදුම්කරුවන්ගේ පහත සඳහන් සමත්කම් පරීක්ෂා කර බලනු පිණිස ප්‍රශ්න දෙනු ලැබේ :—

(අ) ප්‍රකාශ කිරීමේ ශක්තිය ;

(ආ) සාමාන්‍ය දුෂ්කරතාවයන් ඇති වාක්‍ය ඛණ්ඩයන්ගේ අවබෝධය (මෙම ඡේදයෙන් ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලයීය ප්‍රකාශන හෝ වර්තමාන කර්තෘවරුන්ගේ ග්‍රන්ථයන්ගෙන් උපුටාගනු ඇත) ; සහ

(ඇ) භාෂා සම්ප්‍රදාය සහ වචන මාලාව පිළිබඳ දැනුම.

**(ආ—විෂයය)—සිංහල භාෂාව.**—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචක පරීක්ෂණයක් ද අයත් වේ :—

(අ) සිංහල භාෂාව 1½ (සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය 1½) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන දේ ඉංග්‍රීසියට පරිවර්තනය කළ යුතු ය :—

(i) ප්‍රවෘත්ති පත්‍රයකින් හෝ වර්තමාන ගද්‍ය ග්‍රන්ථයකින් උපුටා ගත් කොටසක් ;

(ii) සාමාන්‍ය දුෂ්කරතාවයෙන් යුතු ලියමනක්, පෙත්සමක්, ඔප්පුවක් හෝ වාර්තාවක්.

වාග් සම්ප්‍රදායානුකූල යෙදීම නිවැරදි ව සම්ප්‍රදායානුකූල ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවාට ඇති දක්ෂකම පරික්ෂා කිරීමට ප්‍රශ්න දෙනු ලැබේ. පරිවර්තනය කිරීම සඳහා වූ ඡේද අත් පිටපත් මගින් දෙනු ලැබේ.

(ආ) සිංහල භාෂාව II (ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය කිරීම, කාල සීමාව පැය 1½ යි) පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් අයදුම්කරුවන් විසින් පරිවර්තනය කළ යුතුය :—

මහෙස්ත්‍රාත් උසාවියක හෝ දිස්ත්‍රික් උසාවියක විභාග වූ නඩුවක තීන්දුව, ආඥාපනතකින්, අතුරු නීතියකින්, ගැසට් නිවේදනයකින්, හැන්සාඩ් වාර්තාවකින් හෝ වෙනත් ආණ්ඩුවේ ප්‍රකාශයකින් උපුටා ගත් කොටසක් අයදුම්කරුවන් විසින් ඉංග්‍රීසි වාග් සම්ප්‍රදායානුකූල ඡේදයන් පරිවර්තනය කිරීම ද අවශ්‍ය වන්නේ ය.

(ඇ) **වාචක පරීක්ෂණ.**—මෙහි දී පහත දැක්වෙන දේවලට අවධානය යොමු කරවනු ලැබේ. ව්‍යවහාරයෙහි ඇති සාමාන්‍ය පාරිභාෂික පද පරිවර්තනය කිරීම, සිංහලෙන් අදහස් ප්‍රකාශ කිරීමේ ඇති පහසුකම්, සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් වාග් සම්ප්‍රදායානුකූල ඡේදයන් උච්චාරණය කිරීම සහ ඒ පිළිබඳ දැනීම.

කලින් සූදානමක් නැතිව, ප්‍රථම වතාවට දෙන ලද ඉංග්‍රීසි ලිපියක, වාර්තාවක හෝ වෙනත් කාර්යාලීය ලිපි කඩදාසියක පරිවර්තන යක්, කට වචනයෙන් දීමට අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

**(ඇ—විෂයය)—දෙමළ භාෂාව.**—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචික පරීක්ෂණයක් ද අයත් වේ.

(අ) දෙමළ භාෂාව I (දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය 1½) ;

(ආ) දෙමළ භාෂාව II (ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය 1½) ;

(ඇ) **වාචක පරීක්ෂණය.**—දෙමළ භාෂාව I, දෙමළ භාෂාව II සහ දෙමළ වාචක පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා, සිංහල භාෂාව I සිංහල භාෂාව II සහ සිංහල වාචක පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා මෙනි.

6. පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යයක් ලබා ගැනීමට අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන අන්දමින් ලකුණු ලබාගත යුතුය :—

ඉංග්‍රීසි භාෂාවෙන් සියයට ... ... 40ක්<br>
සිංහල භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට 40ක්<br>
දෙමළ භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට 40ක්

7. අ, ආ සහ ඇ යන විෂයයන්ගෙන් විෂයයන් දෙකකින් සාමාර්ථ්‍යය ලබන අයදුම්කරුවන්ට, ඔවුන් විසින් සාමාර්ථ්‍යය ලබන ලද එක් එක් විෂයයේ ලකුණුවල මුළු ගණනින් සියයට 50ක් ලබා තිබුණහොත් තුන්වෙනි විෂයය එම විභාගය පවත්වන ඊළඟ අවස්ථාවේ දී පමණක් ගැනීමට අවසර දෙනු ලැබේ.

8. පරීක්ෂණය පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් විසින් නියම කර ඇති නීති සහ රෙගුලාසිවලින් අයදුම්කරුවන් බැඳී සිටිනු ඇත.

9. **දීමනා.**—සාමාන්‍ය ලිපිකරු සේවයේ නිලධාරීන්ට (විශේෂ ශ්‍රේණියේ සාමාජිකයින් හැරෙන්නට) පහත දැක්වෙන කොන්දේසි යටතේ රුපියල් 20ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ :—

(i) නිලධාරියා භාෂා පරිවර්තකයෙකු වශයෙන් සේවයේ යෙදී සිටිය යුතුය. උසාවිවල අතිරේක භාෂණ පරිවර්තකයින් මෙන් සේවයේ යෙදී සිටින නිලධාරීන්ට දීමනාව හිමි නොවන්නේ ය.

(ii) නිලධාරියා භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් විය යුතු වෙයි. දැනට භාෂණ පරිවර්තකයින් වශයෙන් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ට, එම පරීක්ෂණයෙන් සමත් වන තුරු දීමනාවකට හිමිකමක් නොලැබෙන්නේ ය.

(iii) තෙමසක කාල සීමාවක් තුළ, මහෙස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා හෝ කොමිසමේ සභාපතිවරයා තෘප්තිවන අයුරින් ඔහු උසාවියක, විනිශ්චය සභාවක, පරීක්ෂණ කොමිසමක ආදියෙහි කටයුතුවල දී භාෂණ පරිවර්තකයකු වශයෙන් ක්‍රියා කොට තිබිය යුතුය. මේ කාල සීමාව තුළ දී, ඔහුට දීමනාව ගෙවනු නොලැබේ. ඔහු භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් වී තිබුණත්, එම කාල සීමාව තුළ දී මහෙස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පැමිණවීමට ඔහු අසමත් වූවහොත් ඒ හේතුවෙන් දීමනා සම්බන්ධයෙන් ඔහුට ඇති හිමිකම් වැළකී යනු ඇත. එමෙන් ම ඔහුගේ එම අසමත් වීම නිසා, ඔහු අවස්ථාවට සුදුසු පරිදි, සාමාන්‍ය ලිපිකරු සේවයේ වෙනත් තනතුරකට මාරු කරනු ලැබිය හැක. එම නිලධාරියා මහෙස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත් කරන ලද්දේ නම්, අතීතයටද වලංගු වන සේ ඔහුට දීමනාවක් ගෙවනු ලැබිය හැක. එම දීමනාවන් ඔහුට ගෙවනු ලබන්නේ භාෂණ පරිවර්තකයන්ගේ පරීක්ෂණය හෝ එම තනතුරට පත් කරනු ලැබීම යන දෙකින් වඩා මෑතක වූ දෙය සිදු වූ දින සිට ය.

(iv) භාෂණ පරිවර්තකයින්ගේ පරීක්ෂණයෙන් සමත්ව දීමනා ලබාගත් නිලධාරියෙක් වෙනත් වැඩකට මාරු කරනු ලැබ නැවත වරක් භාෂණ පරිවර්තක තනතුරකට මාරු කරන ලද නම්, නවදුරටත්, විභාගයක් නො පවත්වා, දීමනාව ගෙවනු

ලැබේ. එසේ කරනු ලබන්නේ ඔහු භාෂණ පරිවර්තක තනතුරින් ඉවත්ව ගත වූ කාලය අවුරුද්දකට අඩුවේ නම් පමණකි. එසේ ගතවූ කාලය අවුරුද්දකට වැඩි වේ නම් දීමනාව ලැබීමට සුදුස්සකු වීමට ප්‍රථම එම නිලධාරියා විසින් (iii) වෙනි වගන්තියේ ප්‍රකාර, ඔහුගේ සාමාර්ථතාවය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත්කළ යුතු වන්නේ ය.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

| විභාග අංකය |
|---|
| ................ |
| කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි |

## ආදර්ශ ඉල්ලුම්පත්‍ර පෝර්මය

### භාෂණ පරිවර්තකයින් සඳහා වූ විභාගය—1970 අප්‍රේල්

| | |
|---|---|
| 1. ඔබේ පුරුදු අත්සන ...<br>මුල් අකුරු සහිත ඔබේ නම ...<br>(පැහැදිලි ලොකු අකුරෙන්)<br>ඔබේ නම සියල්ල සම්පූර්ණයෙන් ...<br>(පැහැදිලි ලොකු අකුරෙන්) | |
| 2. සම්පූර්ණ ලිපිනය ... ...<br>(කාර්යාලයීය පමණකි) | |
| 3. පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න :—<br>(i) ඔබ දැනට උසාවියක භාෂණ පරිවර්තක පදවියක් දරන්නෙහිද යන වග ...<br>(ii) ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයෙහි සාමාජිකයෙක් වන්නෙහි ද යන වග සහ එසේ නම් ඔබේ පන්තිය සහ ශ්‍රේණිය ... ... | |
| 4. ඔබ සේවය කරන දෙපාර්තමේන්තුවේ නම ... ... | |
| 5. විභාගය සම්පූර්ණ කිරීම පිණිස ඔබ ගනු ලබන්නේ එක් විෂයයක් පමණක් නම් පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න :—<br>(i) ඔබ සුදුසුකම් ලැබූ පසුගිය විභාගය සඳහා ලද සූචි අංකය<br>(ii) ඔබ දැන් ගන්නා විෂයය ... | |

මා විසින් කරන ලද මේ ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසයේ පරිදි සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් මම සහතික කරමි. භාෂණ පරිවර්තකයකු ලෙස මා පත් කෙරෙන ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමටත්, මෙම විභාගය පිළිබඳ රෙගුලාසි වලට එකඟව ක්‍රියා කිරීමටත් බැඳෙමි.

————,
අපේක්ෂකයාගේ අත්සන,
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී).

දිනය :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බව මෙයින් සහතික කරමි.

————,
(අත්සන සහ අත්සන් කරන නිලධාරියාගේ පදවි නාමය.)
(දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ පදවි නාමය).

දිනය :————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ... නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභා... කට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කි...

(v) සහතික පත්‍රය යම් කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ... ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම ... විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රි... සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර ... විභාගයට පසුව හෝ කොයිම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේ... ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ... වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ... එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලැ... විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේ... කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

#### නීති

සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුලදීත් ඒ අසලදී... විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේ... ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙ... ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉ... පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තා... එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත් විභාගය පට... ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්... හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීමට පටන් ගෙන පැ... බාගයක් ගත වූවාට පසු මොනම කාරයණක් නිසාවත් විභාගාපේ... ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පට... ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටි... අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්... ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට ප... පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ... තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දර... ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභා... ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථාන... වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක්... ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලක... ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු... මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභා... ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලා... ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක්... නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම ... වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම්... යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතා බස් කි... ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලා... පතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂ... යකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න ද... මක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක... ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන ක... දාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කි... තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නොසැලකීම වං... නික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන... පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ... අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්... කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්... උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටස්... විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභා... ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යාම තහනම්... එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය... පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරී... වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම... නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකම්යෙහිදී තමන්ගේ... චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල් පමාත්‍රයෙන් සේ...

ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත් වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයෑම තහනම් ය. මේ සියලු ම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත්බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීමට වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවීයාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතිත්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාගශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්.**—විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය ;

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෑජර් කඩදාසි, සාරාංශය ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුනොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතු ය. විභාගශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතු යි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වනු බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදි ව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිගු පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර වියයුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ඊ. ඩබ්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදී යැ.

2–812—70.2.20 දින අංක 14,894 දරණ ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. මෙරට සෑදූ කැරම් ලෑලි හා දාම් ලෑලි සැපයීම ... | 1970.3.24 |
| 2. පිඩන ලාම්පු සැපයීම ... | 1970.4.7 |
| 3. ලෝහ ඔප කරන ද්‍රව්‍ය සැපයීම ... | 1970.4.7 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි මස 20 දින,
කොළඹදීය.

2–745—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1) 1970.4.1 සිට 1970.9.30 තෙක්, සපුගස්කන්දේ පිහිටි ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ සිට කැලණිය හා නුඹුණුපිටිය දුම්රිය ස්ථානවලට සහ "කැප්ටන් ගාර්ඩන්" දුම්රිය අංගනය දක්වා පීප්පවල පුරවන ලද බිටුමන් ප්‍රවාහනය කිරීම සඳහා 1970 මාර්තු මස 17 වෙනි අඟහරුවාදා පෙ. ව. 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මෙම සේවය සඳහා ලාංකිකයින්ට සහ ලාංකික සමාගම්වලට පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100 ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 මාර්තු මස 16 වෙනි සඳුදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි 20 දින,
කොළඹදීය.

2–744—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### පළිඟුවක් හෝ කෘතිම පළිඟුවක් සපයා මිහින්තලේ මහාසෑයේ පින්තල කොතට සවිකිරීම සඳහා ටෙන්ඩර්

දෙපාර්තමේන්තු අංක ආර්.ඇම්.ඇස්. මිහින්තලේ 16 සහ 205 දරණ සැලැස්ම අනුව පළිඟුවක් හෝ කෘතිම පළිඟුවක් සපයා මිහින්තලේ මහසෑයේ පින්තල කොතට සවිකිරීම සඳහා ටෙන්ඩර් 1970 මාර්තු මස 5 වැනි දින පස්වරු 3 වනතෙක් මෙම දෙපාර්තමේන්තුවේදී භාරගනු ලැබේ.

පුරාවිද්‍යා කොමසාරිස්ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙවැනි පිටපතක් සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් 1970 මාර්තු 4 වැනි දින පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය. මෙකී මුදල මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් නැතහොත් පුරාවිද්‍යා කොමසාරිස්ගේ නමට මුදල් ඇණවුමක්/තැපැල් ඇණවුමක් එවීමෙන් ටෙන්ඩර් පත් ලබාගත හැකිය.

වැඩිමනත් විස්තර පුරාවිද්‍යා කොමසාරිස්ගෙන් ලබාගත හැකිය.

ආර්. එච්. ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

ඇස්.ඇස්. 526,
1970 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 7, සර් මාකස් ප්‍රනාන්දු මාවතේ,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදීය.

2–814—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බම්බලපිටිය තට්ටු නිවාසයන්හි ජනේල නැවත සවි කිරීම

බම්බලපිටිය තට්ටු නිවාසයන්හි යකඩ ජනේල වෙනුවට ලී ජනේල සවි කිරීම සඳහා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු 6 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. එකී වේලාවේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවාක් මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, රජයේ දෙපාර්තමේන්තුවල සහ රජයේ සංයුක්ත මණ්ඩලයන්හි ගොඩනැගිලි වැඩ සඳහා රු. 25,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි ඇති කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 25 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි 27 දින දවල් 12 තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544, 1970 පෙබරවාරි 13 දින,
කොළඹ.

2–808—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුවට මෝටර් ලෝන්ච් යාත්‍රාවක් සැපයීම

මෝටර් ලෝන්ච් යාත්‍රා එකක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. අංක 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු 25 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

3. ටෙන්ඩර්, කොළඹ පොලිස් මූලස්ථානයේ, පොලිස්පතිගෙන් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රයෙහි ලියා පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970 මාර්තු 24 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. මෙම තැන්පත් මුදල පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

මේ පිළිබඳ වැඩිමනත් විස්තර පොලිස්පති කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඇල්. එම්. ජෝෂප්,
පොලිස්පති වෙනුවට.

1970 පෙබරවාරි 11 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේ දීය.

2–754—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### කිලිටි රෙදි ඇපිල්ලීම

**සේවය.**—1970.4.1 දින සිට 1971.3.31 දින (දෙදින ඇතුලුව) අවුරුද්දක් තුල මෙම දෙපාර්තමේන්තුවේ—නාවික නියමු ස්ථානයේ, ප්‍රධාන මුර සංචාරක නිලධාරිතැනගේ කාර්යාලයේ, ඇපොතිකරි දෙදෙනාගේ කාර්යාලවල, සහ ලේඛණාගාරයේ යන ස්ථානවලින් එකතුකරගන්නා කිලිටි රෙදි පිරිසිදුකොට භාරදීම සඳහා (වරාය ප්‍රදේශයට ඇතුල්වීම සඳහා අවශ්‍ය බලපත්‍රද, නාවික නියමු ස්ථානයේ ඇඳුම් එකතුකිරීමේ පහසුව සඳහා මසකට 4 වරක් ලෝන්ච් යාත්‍රාවක්ද සපයනු ලැබේ. දෙපක්ෂය එකතුවී මේ දිනයන් ගැන තීරණය කට එළඹිය යුතුය.) වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් පත්‍ර සහ තැන්පත් මුදල්.**—1970 මාර්තු මස 8 දින පස්වරු 2.30 දක්වා කොළඹ 1, වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ. එදින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර, පුද්ගලිකව මෙම කාර්යාලයට පැමිණ හෝ තැපෑලෙන් හෝ ලබාගත හැක. තැපැල් මගින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන්නන්ට තම තමන්ට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කල්වේලා ඇතිව ලබාගන්නා ලෙස මතක්කරමි. ටෙන්ඩර් ආකෘති පත්‍ර එක කට්ටලයක් වෙනුවෙන් රු. 25ක මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට එම රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් හෝ රු. 25 වටිනා චැක් පතක් එවීමෙන් හෝ ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ටෙන්ඩරය" යන්න පැහැදිලිව සටහන් කළ යුතුයි. පිටපත් 2 කින් යුක්තකොට එවිය යුතු මෙම ආකෘති පත්‍ර දෙපාර්තමේන්තුව සැපයූ ඒවාම විය යුතුයි. යම් යම් හේතූන් නිසා ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් පත්‍ර ගැන මෙම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. මෙම ඇප තැන්පත් මුදල් ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු ගෙවනු ඇත. 1970.3.8 දින ප. ව. 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය හිමි තැනැත්තා ඇපයක් තැබීමට (එලෙස කළයුතුයයි තීරණය කරණු ලැබුවහොත්) සූදානම්ව සිටිය යුතුයි.

3. **සෝදන කෑලි ප්‍රමාණය සහ මිල ගණන්.**— සාමාන්‍ය වශයෙන් ඒ ඒ කෑලි ගණන් ටෙන්ඩර් ආකෘති පත්‍රවල දක්වා ඇත. කාර්යාලයේදී ද ඒ විස්තර පරීක්ෂාකර බැලිය හැක. ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් පළමුවෙනි ඡේදයේ සඳහන් කරන ලද කාල සීමාව ඇතුලතදී වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4. **ටෙන්ඩරය භාරගැනීම.**—පිළිගත් ටෙන්ඩරය හිමියා බැඳුම්කරය පොරොන්දු පත්‍රය ආදිය නිසියාකාරව අත්සන්කර භාරදීමෙන් පසුව පමණක් වැඩ භාරදෙනු ලැබේ. ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතිනු ඇත.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1970 පෙබරවාරි 7 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායඞාලයේ දීය.

2–591—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### මෝදර ක්‍රීඩා භූමියේ තණකොල වැවීම

මෝදර ක්‍රීඩා භූමියේ තණකොල වැවීම සඳහා 1970 මාර්තු මස 9 වැනි දින දහවල් 12 දක්වා කොළඹ වරාය කොමසාරිස් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් ටෙන්ඩර් පිළිබඳ ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

3. ටෙන්ඩර් කොන්දේසි අනුව රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගන්නා ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 මාර්තු මස 8 වැනිදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. 1970 මාර්තු මස 9 වැනිදා පස්වරු 2. 30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණිය හැකිය.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1970 පෙබරවාරි 10 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායඞාලයේ දී ය.

2-–738–70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—පොළොන්නරුව

පොළොන්නරුවේ දිසාපති විසින් මෙහි පහත සඳහන්කර ඇති උපලේඛනයේ සඳහන් වැඩ සඳහා 1970 මාර්තු මස 21 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් ඉල්වීමක්ම පිටපත් දෙකකින් යුක්ත වියයුතු අතර එය බහාලන කවරය මුද්‍රා තබා පොළොන්නරුවේ දිසාපති වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය. ටෙන්ඩර් බහා ඇති සෑම කවරයකම පිටපැත්තේ තමා විසින් ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ කුමන වැඩක් සඳහාද යන්න පැහැදිලිවම සඳහන්විය යුතු අතර එක් එක් වැඩය සඳහා වෙන් වෙන්ව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ටෙන්ඩර් ෆෝර්මවල වේ.

4. ටෙන්ඩර් ෆෝර්ම 1970 මාර්තු මස 20 දින දක්වා පොළොන්නරුව දිසාපති කාර්යාලයේ ගිණුම් අංශයෙන් නිකුත් කරනු ලැබේ.

5. පොළොන්නරුව දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය විසින් මෙම ටෙන්ඩර්පත් 1970 මාර්තු මස 21 දින පෙ. ව. 10.30 ට පොළොන්නරුව දිසාපති කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර් ඉල්ලුම් කරුවන් හෝ ලියවිල්ලකින් ඔවුන්ගේ බලය ලබාගත් නියෝජිතයින් හෝ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුය. ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති අයවලුන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් කර ඇති මුදල් ප්‍රමාණයන්ද ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසුව ප්‍රකාශ කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ඉදිරිපත් කර නැති ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කර ඇති මුදල ටෙන්ඩර් ෆෝරමයේ අකුරින් හා ඉලක්කම් වලින්ද සඳහන් කළ යුතුයි. අකුරින් සඳහන් කර ඇති මුදල ඉලක්කම් වලින් සඳහන්කර ඇති මුදලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. යම් ටෙන්ඩර් ඉල්ලුම් කරුවෙකුගේ ටෙන්ඩරය භාරගත් බැව් දන්වා දින 7 ක් ඇතුලත එම ටෙන්ඩර්කරුට පොළොන්නරුවේ දිසාපති සමග ගිවිසුමකට අත්සන් කිරීමට නොහැකි වුවහොත් හෝ එසේ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් එබඳු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද

ටෙන්ඩරය මා විසින් භාරගත් බැව් ලියාපදිංචිකල තැපෑලෙන් යැවෙන ලිපියකින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට දන්වා යැව්වහොත් ඉල්ලුම්කරුට එය ලැබුන බැව් පිළිගනු ලැබේ.

8. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ප්‍රතික්ෂෙප කිරීමේ බලයත් යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාර ගැනීමේ බලයත් පොළොන්නරුවේ දිසාපති වෙත පවරාගෙන ඇත.

9. පිළිනොගත් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත්කර ඇති ඇප මුදල් පිළිගත් ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු සමග ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ ඇති සෑම මැකීමක්ම හෝ වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරු විසින්ම කෙටි අත්සන් යොදා සහතික කළ යුතුය.

11. පොළොන්නරුවේ දිසාපතිගෙන් ලිපියකින් ලබාගත් අවසරයක් නොමැතිව තමා ලබාගත් කිසිම කොන්ත්‍රාත්තුවක් අන් අයෙකුට පැවරිය නොහැකිය.

12. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කර ඇති මුදලින් සියයට දහයක මුදලක් ඇප මුදල් වශයෙන් කච්චේරියේ තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කරනු ලබන්නේ මෙම මුදල කච්චේරියේ තැන්පත් කර කුවිතාන්සියක් ලබාගත්තායින් පසුවය.

13. ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පෝර්ම සුපරීක්ෂාකාරීව කියවා බැලිය යුතු අතර ඒ සම්බන්ධයෙන් කිසියම් කරුණක් පැහැදිලි කරගැනීමට අවශ්‍ය වුවහොත් ඒ පිළිබඳව පොළොන්නරුව දිසාපති කාර්යාලයේ ගිණුම් අංශයෙන් විමසා බැලිය යුතුය.

14. කොන්ත්‍රාත්තුව විධිවූ පරිදි ඉටු කිරීම සඳහා ඇප වන්නාවූ වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකු විසින් අත්සන් කරන ලද ලිපියක්ද ඔවුන්ගේ ලිපිනයන්ද එක් එක් ටෙන්ඩරය හා සමග ඉදිරිපත් කළ යුතුය.

15. මෙම කොන්ත්‍රාත්තුවල වැඩ සඳහා ලාංකික කම්කරුවන් පමණක් යොදා ගැනීමට කොන්ත්‍රාත්කරු වග බලාගත යුතුය.

16. (අ) සමුපකාර සමිති මගින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී මෙම කොන්ත්‍රාත් වැඩ භාර ගැනීමට ඒ ඒ සමිති වලට හැකියාවක් ඇති බවත්, ඒ ඒ සමිතිවල මුදල් තත්ත්වය සම්බන්ධයෙන් ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක හෝ තැන්පත් කර ඇති මුදල් සම්බන්ධයෙන් වූ විස්තර දැක්වෙන සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමා විසින් නිකුත් කරන ලද ලිපියක්ද මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

(ආ) අනෙකුත් අයවලුන්ගේ ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔවුන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් හා එම අයගේ මුදල් තත්ත්වය සම්බන්ධයෙන් වූ විස්තරත් (ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක තැන්පත් මුදල්) අඩංගු, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතුමා විසින් නිකුත් කරන ලද ලිපියක් ද මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

17. මුදල් තත්ත්වය සතුටුදායක නොවන සමිති වලින් හෝ පුද්ගලයින් විසින්ද ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය දිසාපතිතුමා විසින් පවරාගෙන ඇත.

18. උප ලේඛනයේ සඳහන් වැඩ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

ඒ. පී. ජී. ජයසේකර,
පොළොන්නරුවේ දිසාපති වෙනුවට.

1970 පෙබරවාරි මස 11 දින,
පොළොන්නරුව දිසාපති කාර්යාලයේ දී.

## උපලේඛනය

(1) නව නගරයේ පිහිටි අංක 5 බී 1 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(2) නව නගරයේ පිහිටි අංක 3 ඒ. 2 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(3) නව නගරයේ පිහිටි අංක 3 ඒ. 3 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(4) නව නගරයේ පිහිටි අංක 3 ඒ. 4 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(5) නව නගරයේ පිහිටි අංක 3 ඒ. 6 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(6) නව නගරයේ පිහිටි අංක 3 ඉසඩ්. 2 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(7) නව නගරයේ පිහිටි අංක 3 ඉසඩ්. 5 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(8) නව නගරයේ පිහිටි අංක 3 ඉසඩ්. 7 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(9) නව නගරයේ පිහිටි අංක 3 ඉසඩ්. 11 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(10) කදුරුවෙල පිහිටි අංක 12 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(11) කදුරුවෙල පිහිටි අංක 13 දරණ ස්වදේශ අමාත්‍යාංශයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

(12) කදුරුවෙල ප්‍රාදේශීය ආදායම් කාර්යාලය හා මහජන බැංකු කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ ජලනල මාර්ගය අලුත්වැඩියා කිරීම.

2–736—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපු කච්චේරිය

### 2 ශ්‍රී 4594 දරණ අබලන් 'විලීස්' ජීප් රථය විකිණීම

දැනට මඩකලපු කච්චේරි භූමියෙහි තිබෙන ඉහත සඳහන් අබලන් 'විලීස්' ජීප් රථය විකිණීම සඳහා 1970 මාර්තු 16 වැනි දින පෙරවරු 10 තෙක් මඩකලපු කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සීල් තබා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ විගස එදිනම ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ඇත.

රු. 100ක මුදලක් මඩකලපු දිසාපති වෙත තැන්පත් කළ පසු මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. 1970 මාර්තු මස 16 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ඇත. ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කච්චේරිය, මඩකලපුව යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් පුද්ගලිකව පැමිණ මඩකලපු කච්චේරියේ කාර්යාල සහකාර තැනට භාර දිය යුතුය. ටෙන්ඩර් පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "2 ශ්‍රී 4594 සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

වැඩ කරන ඕනෑම දිනක කාර්යාලීය වේලාවන් තුළදී මඩකලපු දිසාපති තුමාගේ අවසරය පිට රථය කච්චේරි භූමියේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

ටෙන්ඩරය භාරගත් බවට දනුම් දුන් දින සිට සතියක් ඇතුළතදී සාර්ථක ටෙන්ඩර්කරු විසින් තමා ටෙන්ඩර් කළ මුළු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා රථය කච්චේරි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඉදිරිපත් කරනු ලබන කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මඩකලපු කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු වන්නේ ය.

වැඩිදුර විස්තර සඳහා මඩකලපු කච්චේරියෙන් විමසන්න.

කේ. ඊ. ජේ. එඩ්ගාර් ප්‍රනාන්දු,
අතිරේක දිසාපති,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970 පෙබරවාරි මස 9 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

2–799—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහකනදරාව උප කොටස

මහකනදරාව ව්‍යාපාරය යටතේ පහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් අයදුම්පත් උතුරු මැද කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන, අනුරාධපුර විසින් 1970.3.17 දින, පෙරවරු 10 දක්වා භාරගෙන එදිනම එවේලෙම විවෘත කරනු ලැබේ:—

(1) මහකනදරාව දකුණු ඉවුරේ ඇල මාර්ගය—ගල් අතුරා තාර දැමීම සැ. 5 සිට 7 දක්වා.

(2) මහකනදරාව, දකුණු ඉවුරේ ප්‍රධාන ඇල මාර්ගය ගල් අතුරා තාර දැමීම සැ. 7 සිට 8 දක්වා.

2. රු. 48,000 ක මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන හා සමූපකාර සමිතිවලට මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් එවිය හැකිය.

3. 1970.3.13 දින කාර්යාල වේලාවන් තුළදී මහකනදරාව, අනුරාධපුරය, පදවිය හා රාජාංගනය. වාරිමාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම වල පමණක් ටෙන්ඩර් අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් අයදුම්පත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන අයදුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට මෙම දෙපාර්තමේන්තුවේ කරණ වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන සහතිකයක් වාරිමාර්ග ඉංජිනේරු වෙත ඉදිරිපත් කළයුතුය. ටෙන්ඩර් පෝර්ම ඉදිරිපත් කිරීමට ප්‍රථම එක් එක් සේවාව සඳහා රු. 50 ක තැන්පත් මුදලක් වාරිමාර්ග කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක එම මුදල් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහකනදරාව, වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් රාජකාරී වේලාවන් තුළදී ලබා ගත හැකිසි.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනදරාව උප කොටස,

1970.2.7 දින,
මිහින්තලේදී.

2–639—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තුරුවිල වැව වැඩි දියුණු කිරීම සඳහා අනුරාධපුර, උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 මාර්තු මස 17 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 33,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970 මාර්තු මස 13 වෙනි දින දහවල් 12 දක්වා අනුරාධපුර/පදවිය/මහකනදරාව/රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලබාදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඇස්. සබාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උප කොටස.

1970.2.9 වෙනි දින,
අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයේ දීය.

2–677—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාතීමේන්තුව—අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වන්නියම්කුලමේ ස්ථිර ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම සඳහා අනුරාධපුර, උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 මාර්තු මස 17 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින, එවේලේම, එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 18,500 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970 මාර්තු මස 13 වෙනි දින දහවල් 12 දක්වා අනුරාධපුර/මහකනදරාව/පදවිය/රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4, ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඇස්. සබාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
අනුරාධපුර උප කොටස.

1970.2.10 වෙනි දින,
අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයේදී ය.

2–741—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය.

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### "ග්‍රවුන් ෂීට්" (මැෂිකබාවලට සමාන) නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය

කොළඹ—2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් "ග්‍රවුන් ෂීට්" නිෂ්පාදනය කිරීම සඳහා 1970 මාර්තු මස 9 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. මෙම නිෂ්පාදනයට අවශ්‍ය අඟල් 52 ක් පළල "ආර්පිහයිඩ්" රෙදි ගුවන් හමුදාව මගින් සපයනු ඇත.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස කොළඹ—2, ශ්‍රීමත් චිත්තම් පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1970 මාර්තු මස 8 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ—2, ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

2–795/1—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ගුවන් ගමන් සඳහා පාවිච්චි කරන අත් ඔරලෝසු විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, කටුනායක රාජකීය ලංකා ගුවන් හමුදාවේ සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ ඇති පහත සඳහන් "බූම්" වර්ගයේ ගුවන් ගමන් සඳහා පාවිච්චි කරන අත් ඔරලෝසු විකිණීම සඳහා 1970 මාර්තු මස 9 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| (i) ක්‍රියාකාරිත්වයෙන් යුත් "බූම්" වර්ගයේ අත් ඔර්ලෝසු—අනුක්‍රමික අංක 533/8, 533/1, 533/2, 534/11 | 04 |
| (ii) අලුත්වැඩියා කිරීම් අවශ්‍ය "බූම්" වර්ගයේ අත් ඔර්ලෝසු—අනුක්‍රමික අංක 534/12, 533/7, 533/5, 533/10 | 04 |
| (iii) ක්‍රියාවිරහිත "බූම්" වර්ගයේ අත් ඔර්ලෝසු—අනුක්‍රමික අංක 533/4 | 1 |

2. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1970 මාර්තු මස 8 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2 පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

2–795/2—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ක්‍රියාවිරහිත පාපැදි විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලසථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ ඇති ක්‍රියාවිරහිත පාපැදි විකිණීම සඳහා 1970 මාර්තු මස 9 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම කොළඹ—2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදු මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබාගත හැකි රු. 75 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1970 මාර්තු මස 8 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

2–795/3—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### එල්. 312/42 වර්ගයේ "ටාටා බෙන්ස්" ට්‍රක් වැසි තුනකට, රියැදුරු කාමර සහිත, හමුදා පාවිච්චියට සුදුසු, බඩු ගෙන යා හැකි බොඩි නිෂ්පාදනය කිරීමේ සහ සවි කිරීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එල්. 312/42 වර්ගයේ 'ටාටා බෙන්ස්' ට්‍රක් වැසි තුනකට රියැදුරු කාමර සහිත, හමුදා පාවිච්චිය සුදුසු, බඩු ගෙන යා හැකි බොඩි නිෂ්පාදනය කිරීම සහ සවි කිරීම සඳහා 1970 මාර්තු මස 9 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. නිෂ්පාදනය සහ සවිකිරීමට යෝජිත රියැදුරු කාමර සහ බොඩි වල සියලුම විස්තර ටෙන්ඩර් පතෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබා ගත හැකි රු. 250 ක ටෙන්ඩර තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1970 මාර්තු මස 8 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

2–795/4—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහවැලි යෝජනා ක්‍රමය

මහවැලි ගඟ යෝජනා ක්‍රමය යටතේ බෝවතැන්න හැරවීමේ ව්‍යාපාරයේ පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්, මහවැලි යෝජනා ක්‍රමයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 මාර්තු මස 17 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා, පොල්ගොල්ලේ පිහිටි ප්‍රාදේශීය වාරිමාර්ග කායසීාලයේ දී භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | ටෙන්ඩර් කරුගේ ලියාපදිංචි මුදල රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. ශ. |
|---|---|---|
| 1. නාඋල, කනිෂ්ඨ නිලධාරිනිගේ තාවකාලික ද්විත්ව ගොඩනැගිල්ල අංක 1 ... ... | 17,000 ... | 25 0 |
| 2. නාඋල, කනිෂ්ඨ නිලධාරීන්ගේ තාවකාලික ද්විත්ව ගොඩනැගිල්ල අංක 2 ... ... | 17,000 ... | 25 0 |
| 3. නාඋල, කනිෂ්ඨ නිලධාරීන්ගේ තාවකාලික ද්විත්ව ගොඩනැගිල්ල අංක 3 ... ... | 17,000 ... | 25 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරි පත් කළ හැකිය.

3. 1970 මාර්තු මස 16 වෙනි සඳුද දක්වා කායර්‍යාල වේලාවන් තුලදී, මහවැලි යෝජනා ක්‍රමය යටතේ ඇති බෝවතැන්න, පොල්ගොල්ල හා උකුවෙල වාරිමාර්ග කායර්‍යාල වලින් ලබා ගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරි පත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ තමන් දනට කරගෙන යන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද කියා සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉන්ජිනේරු තැන වෙත ඉදිරි පත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිලිවෙලට ටෙන්ඩර් පත් මුදල් පොල්ගොල්ල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන අවශ්‍ය සියළුම විස්තර බෝවතැන්න වාරිමාර්ග ඉන්ජිනේරු කායර්‍යාලයෙන් කායර්‍යාල වේලාවන් තුලදී ලබා ගත හැක.

ඇල්. යූ. වීරකෝන්,
වාරිමාර්ග ඉංජිනේරු, මහවැලි යෝජනා ක්‍රමය, බෝවතැන්න.

බෝවතැන්න වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලය,
නාඋල, 1970.2.10.

2-740—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කොළඹ, පොලිස් මූලස්ථානයෙහි දිගු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 මාර්තු මස 13 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,60,000කට නොඅඩු ශ්‍රේණිකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි වර්ෂ 1970 මාර්තු මස 5 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970. 2. 15.

2-898—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ගාලු උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් අයදුම් පත්‍ර තංගල්ලේ ප්‍රාදේශීය ඉංජිනේරු තැන විසින් 24.3.70 ද දවල් 12 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

| වැඩ විස්තර | ලියාපදිංචි මුදල රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| 1. ලෙනගල ඇල සහ මාගල ඇල අළුත්වැඩියා කිරීම ... ... ... | 20,000 ... | 25 |
| 2. හීන් ඇල සහ දඹලව ඇල අළුත්වැඩියා කිරීම... | 20,000 ... | 25 |

ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් කායර්‍යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 21.3.70 වෙනි දින දාවල් 12 ට හෝ ඊට පෙර ටෙන්ඩර් ෆෝර්ම ගාල්ල/මාතර/හම්බන්තොට/තිස්ස වාරිමාර්ග කායර්‍යාල වලින් ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි.

මේ ගැන වැඩි විස්තර ගාල්ල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු,
ගාල්ල උප කොටස.

1970 පෙබරවාරි මස 5 වැනි දින,
වාරිමාර්ග කායර්‍යාලය, ගාල්ල.

2-565—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ගාල්ල

### 1969-70 දෙවන භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිලදී ගැනීම පිණිස ටෙන්ඩර් පත් කැඳවීම

1969-70 වර්‍ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් ම විසින් කැඳවනු ලැබේ.

**මාතර දිස්ත්‍රික්කය.**—දැරංගල, කලුබෝවිටියාන, රොටුඹ, උරුබොක්ක, ඊදඹුකිත, දංගල, දෙනියාය.

**ගාල්ල දිස්ත්‍රික්කය.**—බූස්ස, හියාරේ, පනංගල, බටුවංගල, මණ්ඩලපුර, පිටුවල, හල්විටිගල, දාම්මල, හිනිදුම.

**කලුතර දිස්ත්‍රික්කය.**—තීනියාවල.

2. ගාල්ල, ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදී, ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970 මාර්තු මස 5 වෙනි දින පෙ. ව. 11.30 දක්වා 1969-70 මුදල් වර්‍ෂයේ දෙවන භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(1) වියන ලද ජෝඩු පොල් අතු (අඩි 7 ක් දික් වූ ද, අඟල් 14 ක් පළල් වූ ද, 1,000 ක මිළ).
(2) අළුහුණු බුසල් 1 ක් (එකක්) රාත්තල් 44 කට නොඅඩු බර තිබිය යුතුයි).
(3) තම්බාපු හුණු බුසල් 1 ක් (එකක්).
(4) කළුගල් 6″×9″ කියුබ් වලින්.
(5) තලාපු කළුගල් 2″ කියුබ් වලින්.
(6) තලාපු කළුගල් 1½″ කියුබ් වලින්.
(7) තලාපු කළුගල් 1″ කියුබ් වලින්.
(8) තලාපු කළුගල් ¾″ කියුබ් වලින්.
(9) තලාපු කළුගල් ½″ කියුබ් වලින්.
(10) පිළිස්සූ ගඩොල් 1,000 (4½″×2¾″×8½″).
(11) ගඟ වැලි කියුබ් වලින්.

3. ඉහතින් දැක්වෙන ද්‍රව්‍යයන්ගෙන් අංක 4 සිට 9 දක්වා යටතේ දැක්වෙන ද්‍රව්‍යයන් සඳහා පහත දැක්වෙන ක්‍රමයට මිල ගණන් දක්විය යුතුය.—

(i) ගල්වල ළඟදී අට්ටිගසා කියුබ් ගණනින් භාරදීමට :—
  (අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.
  (ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.
(ii) ගල්වල සිට වැඩපලට කොන්ත්‍රාත්කරුගේ වාහනවලින් ප්‍රවාහනය කර වැඩපොලේදී අට්ටිගසා භාරදීමට :—
  (අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.
  (ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

4. ඉහතින් දැක්වෙන අංක 1, 2, 3, 10 සහ 11 දැක්වෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් පහත දැක්වෙන පරිදි මිල ගණන් දැක්විය යුතුයි :—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් පෝරණුව/ගොඩ දමන ස්ථානය අසලදීම භාරදීමට.
(ආ) වැඩ අංශයට ගෙනැවිත් භාරදීමට.

5. පොල් අතු සහ හුණු සැපයීම් සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන්, එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පතු මුදල් වශයෙන් රුපියල් පණහක් (50 ක්) බැගින් ද, පොල් අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් පණහ (රු. 50) බැගින් ද, තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම් පත් ලබා ගත හැක. සියලුම තැන්පත් මුදල් මගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර, එම රිසිට් පත් ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරි කාර්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම් පත් ලබාගත හැකිය. ටෙන්ඩර් පත් ලබා ගැනීමට හැකි අවසාන දිනය 1970 මාර්තු මස 4 වෙනි දින දවල් 12 තෙක් පමණක් බව සලකන්න.

6. සෑම ටෙන්ඩර් අයදුම් කරුවෙක් ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. හුණු සහ පොල් අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකටම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු අතර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි "ගාල්ල ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා ඉදිරිපත් කළ යුතුයි.

"ගාල්ල ඉඩම් සංවර්ධන නිලධාරී,
ඉඩම් සංවර්ධන කාර්‍යාලය,
නගර ශාලාව,
ගාල්ල."

නැතහොත් ගාල්ල ඉඩම් සංවර්ධන කාර්‍යාලයෙහි ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියෙහි තැන්පත් කළ හැක.

7. 1970 මාර්තු මස 5 වෙනි දින ප. ව. 2.30 ට ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් එම කාර්‍යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. 1970 මාර්තු මස 5 වෙනි දින පෙ. ව. 11.30 පසු ලැබෙන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයැයි සිතේ නම් ටෙන්ඩර් කරුවනට පෙනී සිටිය හැක.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුලත ද්‍රව්‍ය භාරදීමට හැකි විය යුතුයි. එසේ කිරීමට නොහැකිවුවහොත් ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත්කරුවෙකු සේ සලකා ඒ අනුව කටයුතු කරනවා ඇත.

9. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාරගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නො වූ සැපයීම් ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරී සතුය.

එෆ්. බී. ආර්. ද සිල්වා,
ඉඩම් සංවර්ධන නිලධාරී,
ගාල්ල.

1970 පෙබරවාරි මස 7 දින,
ගාල්ලේ, ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදී ය.

2-676—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1969-70 මුදල් වර්‍ෂයේ දෙවැනි භාගය සඳහා අනුරාධපුර කොට්ඨාශයට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

අනුරාධපුර ව්‍යාපාරයේ අනුරාධපුර, කුරුණෑගල, පදවිය සහ පුත්තලම යන දිස්ත්‍රික්කවලට අයත් පහත සඳහන් කාර්‍යාංශ සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970. 3. 10 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කාර්‍යාංශ**

අනුරාධපුර නවනගර අංශය, මහකනදරාව, රාජාංගන දකුණු ඉවුර කාර්යාංශ සහ දේවහුව අංශය.

**කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කාර්‍යාංශ**
**රාජාංගන වම් ඉවුරට අයත් ගොඩනැගිලි අංශ**
**පදවිය දිස්ත්‍රික්කයට අයත් කාර්‍යාංශ**

පදවිය නවනගරයට අයත් ගොඩනැගිලි අංශ

**පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කාර්‍යාංශ**

කිවුල්කැලේ සහ තබ්බෝව ගොඩනැගිලි අංශ

ප්‍රාදේශීය ද්‍රව්‍ය

(1) ඉරු දෙකේ පොල් අතු (දිග අඩි 7 ක් සහ පළල අඟල් 18 කට නොඅඩු) 1,000 බැගින්.
(2) දිය ගසන ලද හුණු බුසලක් සඳහා (රාත්තල් 44 කට නොඅඩු බරක් ඇති)
(3) තම්බාපු හුණු බුසල් වලින්
(4) කළුගල් 6 × 9 කියුබ් වලින්
(5) කැටගල් කියුබ් වලින් (2″×1½″×1″, ¾″ සහ ½″)
(6) පිලිස්සූ ගඩොල් (8¾″×4¼″×2¾″ යන ප්‍රමාණයේ 1,000 බැගින්).
(7) ගංගා වැලි කියුබ් වලින් සැපයීම සඳහා මිල ගණන් වෙන් වෙන්ව දක්විය යුතුයි—
  (අ) වත්තෙන්/පෝරනුවෙන්/ගල්වලෙන් (ලොරි යා හැකි සැතපුම් 5 ක් දුර) ලොරි යා හැකි සථානයක් විය යුතුයි ;
  (ආ) කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමට ගෙනවුත් භාර දීමට ඔහුගේ වාහන වලින් (පැටවීම, බෑම සහ නියමිත අයුරු ඇසිරීම ඇතුළුව).

එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් මුදලින් රු. 50 ක් මෙම කාර්‍යාලයේ තැන්පත් කිරීමෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1970. 3. 10 වැනි දින පෙරවරු 10.30 දක්වා පමනි.

මෙම කායඹාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවල ඉල්ලුම්කල යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1970.3.10 වැනි දින දවල් 12 ට පෙර මෙම කායඹාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ " ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුරය " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ කල හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ .................................... ව්‍යාපාරයට ප්‍රාදේශිය ගොඩනැගිලි උපකරන සැපයීම සඳහා ටෙන්ඩර් යනුවෙන් සඳහන් කල යුතුය. සෑම ඉල්ලුම්කරුවෙකුම ඔහුගේ නම සහ ලිපිනය කවරයේ වම් කෙලවරේ පහත සඳහන් කල යුතුයි.

1970. 3. 10 වැනි දින පස්වරු 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉඩම් සංවර්ධන කායඹාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමින සිටිය හැක.

පිලිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් ඒ බව දන්වා සතියක් ඇතුලත අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇනවුම් වලට අනුව දන්වන දිනයේ සිට සතියක් ඇතුලත උපකරණ සැපයීම කල යුතුයි. මෙම කාලය ඇතුලත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ ද්‍රව්‍ය සැපයීමට අපොහොසත් වන ටෙන්ඩර් කරුවන්ගේ නම් කොන්දේසි කඩකල ටෙන්ඩර් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට සුදුසු වන අතර තැන්පත් මුදල් ද රජයසතු කිරීමට ඉඩ තිබේ. තවද, වැඩි විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් දැන ගත හැකිය.

එන්. බී. එජ්. භාරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1970 ක්වූ පෙබරවාරි මස 8 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

2–675—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### නුවරඑළිය, සීතාඑළිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කේෂ්ත්‍ර අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයට ගොඩනැගිලි උපකරණ සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පේරාදෙණිය, ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු මස 20 වෙනි දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. සැපයීම හා ගෙනවිත් භාරදීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කේෂ්ත්‍ර අළුත්වැඩියා මධ්‍යස්ථානය, සීතාඑළිය, නුවරඑළිය.

| | | විස්කර | ප්‍රමාණය |
|---|---|---|---|
| (අ) | (1) | ගඩොල් ... ... ... | 70,000 |
| | (2) | වැලි ... ... ... | කියුබ් 40 |
| | (3) | කළු ගල් 6" සිට 9" ... ... | කියුබ් 30 |
| | (4) | මැටල් ¾" ... ... ... | කියුබ් 7 |
| | (5) | හුණු (තම්බාපු) ... ... | බුසල් 140 |
| (ආ) | (6) | 1 ශ්‍රෙණියේ පරාල 4" × 2" දිග අඩි 12 ... | අඩි 950 |
| | (7) | 1 ශ්‍රෙණියේ පරාල 6" × 4" දිග අඩි 13 ... | කැලි 16 |
| | (8) | 1 ශ්‍රෙණියේ පරාල 4" × 2" දිග අඩි 8 ... | කැලි 40 |
| | (9) | 1 ශ්‍රෙණියේ පරාල 4" × 4" දිග අඩි 18 ... | කැලි 2 |
| | (10) | 1 ශ්‍රෙණියේ පරාල 4" × 4" දිග අඩි 8 ... | කැලි 4 |
| | (11) | 1 ශ්‍රෙණියේ පරාල 6" × 4" දිග අඩි 12 ... | කැලි 8 |
| | (12) | 1 ශ්‍රෙණියේ පරාල 5" × 3" දිග අඩි 7ට නොඅඩු ... | අඩි 1,045 |
| | (13) | 1 ශ්‍රෙණියේ පරාල 2" × ¾" දිග අඩි 13ට නොඅඩු | අඩි 300 |
| | (14) | 1 ශ්‍රෙණියේ ලෑලි 1" ඝනකම දිග අඩි 8ට නොඅඩු | ව.අඩි 200 |
| | (15) | 1 ශ්‍රෙණියේ ලෑලි 1½" ඝනකම දිග අඩි 7ට නොඅඩු | ව.අඩි 1,240 |
| | (16) | 1 ශ්‍රෙණියේ ලෑලි 1½" × 1'-6" දිග අඩි 8ට නොඅඩු | කැලි, 18 |
| | (17) | 1 ශ්‍රෙණියේ ලෑලි 1½" × 1' දිග අඩි 7ට නොඅඩු... | කැලි, 4 |
| | (18) | 1 ශ්‍රෙණියේ ලෑලි 1½" × 1'-3" දිග අඩි 7ට නොඅඩු | කැලි, 4 |
| | (19) | 1 ශ්‍රෙණියේ ලෑලි 1½" × 1'-6" දිග අඩි 7ට නොඅඩු | කැලි, 4 |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියම තත්ත්වයන් අනුව තිබිය යුතුයි. මෙම උපකරණ 1970 අප්‍රේල් 22 වැනි දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. ටෙන්ඩර්කරුවන්ට මෙම කොටස් දෙකෙන් කොටසකට හෝ කොටස් දෙකටම ටෙන්ඩර් කළ හැකිය.

4. 1970.3.20 දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ දෙපිටපතකින් සකස් කරන ලද ටෙන්ඩර් හොඳින් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා ''සීතාඑළිය කේෂ්ත්‍ර අළුත්වැඩියා මධ්‍යස්ථානයට ගොඩනැගිලි උපකරණ සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් '' යන්න සඳහන් කොට, සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය, පේරාදෙණිය, යන ලිපිනයට 1970.3.20 දින ප.ව. 2.30ට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට දින හතලිහක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුයි.

6. ටෙන්ඩර් සියල්ල එකක් හෝ ඉන් කොටසක් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණිය, ගන්නොරුවේ කෘෂිකර්ම ඉංජිනේරු (සිවිල්) තැනගෙන් ලබාගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
ප්‍රධාන ඉංජිනේරු.

1970 පෙබරවාරි මස 7 වැනි දින,
පේරාදෙණිය, ගන්නොරුවේ ඉංජිනේරු අංශයේදීය.

2–722—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

ත්‍රිකුණාමලය, නාවික වරායේ මුහුදුබත්වී ඇති පහත දැක්වෙන බෝට්ටු ගොඩගෙන ඉවත්කිරීම සඳහා ටෙන්ඩර් කොළඹ තැ. පෙ. 593, රාජකීය ලංකා නාවික හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු මස 8 වන දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

(අ) ක්ලැපන්බර්ග්හි ලෝහ බෝට්ටු එකයි.

(ආ) මිඩ්ල් පොයින්ට්හි ලී බෝට්ටු එකයි.

(ඇ) කොඩ් බේ හි ලී බෝට්ටු එකයි.

තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් මුහුදුබත් වී ඇති බෝට්ටු තුනම ගොඩගෙන ඉවත්කල යුතුය. දියබත්වූ බෝට්ටු තුනට අඩුවෙන් ගොඩ ගෙන ඉවත්කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් ඒ ඒ බෝට්ටු තිබෙන ස්ථානයන් ත්‍රිකුණාමලය භාර නාවික නිලධාරීගෙන් විමසා දැන ගත යුතු අතර, එම ස්ථානය ත්‍රිකුණාමලය භාර නාවික නිලධාරීගේ කායඹ මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් පෙන්වා දෙනු ලැබේ. ටෙන්ඩරය භාරදුන් දිනයේ සිට ලින් අවුරුද්දක් ගතවීමට පෙර මෙම බෝට්ටු තිබෙන ස්ථානයන්ගෙන් ගොඩගෙන ඉවත් කළ යුතුය.

2. ඉහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර්පත් කොළඹ 1, රාජකීය ලංකා නාවික හමුදාවේ, ප්‍රධාන මාණ්ඩලික නිලධාරී (සහාය සහ ක්‍රම) විසින් 1970 මාර්තු මස 5 දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් සේවය සඳහා මොනයම් ටෙන්ඩර් ආකෘති පත්‍රයක් හෝ නිකුත් කිරීමට පෙර රු. 50 ක ආපසු ලබාගත හැකි ඇප මුදලක් තැන්පත් කළ යුතුය. චෙක්පත් භාරගනු නො ලැබේ. මුදල් ඇනවුම් මගින් ගෙවන කල්හි ඒවා නාවික හමුදාධිපති නමින් ලබාගත යුතුය. ටෙන්ඩර් ආකෘති පත් ඉල්ලා සිටින විට ටෙන්ඩර් කරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් දිය යුතුය.

4. තව දුරටත් අවශ්‍ය තොරතුරු 2 වැනි ඡේදයේ සඳහන් කර ඇති නිලධාරියාගෙන් ලබාගත හැක.

ආර්. කුදීර්ගාමර්,
රෙයාර් අද්මිරාල්.
නාවික හමුදාධිපති.

මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593, කොළඹ,
1970 පෙබරවාරි මස 10 දින.

2–663—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ඇල් ඩබ්ලිව්/2/26.

## පුත්තලම කච්චේරිය

රුපියල් 15,000 ට හෝ ඊට වැඩි කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි සඳහන් තැනීම්වලින් එකකට හෝ ඊට වැඩි ගණනක් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 මාර්තු මස 9 සඳු දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

(1) නාත්තණ්ඩිය, මරදකැලේ ජනපදයේ පොදු ළිං 4ක් සෑදීම.

(2) නාත්තණ්ඩිය, තබ්බෝව-අක්කර අසූව ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ පොදු ළිඳක් තැනීම.

(3) නාත්තණ්ඩිය, නාගහකටුව ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ පොදු ළිඳක් තැනීම.

(4) නාත්තණ්ඩිය, පාලුවත්ත ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ පොදු ළිඳක් තැනීම.

(5) නාත්තණ්ඩිය, මට්ටකොටුවැල්ල ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක් තැනීම.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැක්ක හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබාගත හැකි ආකෘති පත් මගින් එකී එක් එක් වැඩය සඳහා වෙන වෙනම පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී එක් එක් වැඩය සඳහා රු. 25 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1970 මාර්තු මස 9 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 පෙබරවාරි මස 5 දින,
පුත්තලම කච්චේරියේ දීය.

2–582—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතුමා විසින් අඟල් 1½ කළුගල් කියුබ් 200 ක් ඉදුරුව දුම්රිය අංගනයට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 මාර්තු මස 20 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1970 මාර්තු 5 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද ඩී. ආර්. විජයවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ,
1970.2.11 වැනි දින.

2–746 —70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## වන සත්ව දෙපාර්තමේන්තුව

පහත සඳහන් සේවාව සඳහා සීල් කර එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ඇච්ලන් චතුරශ්‍රයේ වන සත්ව දෙපාර්තමේන්තුවේ වන සත්ව භාරකාර විසින් 1970.3.16 වැනි දින දහවල් 12 දක්වා භාර ගනු ලැබේ :—

(අ) රුහුණු ජාතික උද්‍යානයේ පලටුපාන හි අමුත්තන්ගේ වැසිකිලියක් හා මුත්‍රා ස්ථාන තැනීම.

2. එක් එක් සේවාව සම්බන්ධයෙන් මිළ ගණන් වෙන වෙනම සඳහන් කර වෙනම කවරයක එවිය යුතුයි.

3. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම 70.3.14 වැනි දින දහවල් 12 දක්වා ආපසු ගත හැකි රු. 50 ක ටෙන්ඩර් පත් මුදලක් ගෙවීමෙන් ලබා ගත හැක.

4. මෙම සේවාව සඳහා එවන ටෙන්ඩර් බහා ඇති කවරයේ උඩ වම් පස කෙළවරේ කුමන සේවාව සඳහා ද කියා සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැක.

5. ගොඩනැගිල්ල නිර්මාණය හා අයපත්‍ර මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළ දී 1970.3.14 වැනි දින දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

6. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් පෝර්මයේ සඳහන් කර ඇත.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
වැඩ බලන වන සත්ව භාරකාර.

1970.2.12 වන දින,
කොළඹ 1,
එච්ලන් චතුරශ්‍රයේ,
වනසත්ව දෙපාර්තමේන්තුවේදී ය.

2–728—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කළුතර

1970 මාර්තු මස 13 වැනි දා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. ක/මතුගම ම. ම. වි. | ... | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 2. ක/මතුගම ම. ම. වි. | ... | විශාල අළුත්වැඩියාව |
| 3. ක/මියුසියස් ගු. වි. | ... | අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම |
| 4. ක/කටුකුරුන්ද ගු. වි. | ... | අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම |
| 5. ක/කඹුරාවල ම. වි. | ... | විද්‍යාගාරය තැනීම. |
| 6. ක/ඉත්තෑපාන ම. වි. | ... | විද්‍යාගාරය තැනීම. |

සංලක්ෂය.—ක= කළුතර දිස්ත්‍රික්කය.

2. කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ කළුතරින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායඝාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 දරණ වැඩය සඳහා රු. 20,000 ට ද අංක 2, 3 දරණ වැඩය සඳහා රු. 30,000 ට ද, අංක 4, 5, 6 දරණ වැඩය සඳහා රු. 40,000 ට ද හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 මාර්තු මස 12 වැනි දා පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සීමා

වලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිට පත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලුම විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යකු විසින් පුද්ගලිකව කළුතර අධ්‍යාපන කායඵාලයේ, කායඵාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 මාර්තු මස 13 වැනි දා පෙරවරු 10.30 ට කළුතර අධ්‍යාපන කායඵාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩරකරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කායඵාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායඵාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

කේ. ඩී. ආරියදාස,
කළුතර ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි මස 10 වන දින,
කළුතර අධ්‍යාපන කායඵාලයේ දී ය.

2–701—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මාර්තු මස 13 වැනි සිකුරාදා පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | මහ/සමන්එළිය මහා විද්‍යාලයය | ... | පාසල් ගොඩනැගිල්ල |
| 2. | නු/පොරමඩුල්ල ම. ම. වි. | ... | අලුත්වැඩියාව |
| 3. | මහ/සමන්එළිය ම. වි. | ... | පාසල් ගොඩනැගිල්ල සහ වැසිකිළිය |
| 4. | මහ/සමන්එළිය මහා විද්‍යාලයය | ... | ගුරු නිවාසය |
| 5. | මහ/ලක්ෂපාන මහා විද්‍යාලයය | ... | කර්මාන්ත ශාලාව |
| 6. | නු/කොටගල විද්‍යාලයය | ... | ගුරු නිවාසයේ ඉදිරි වැඩ |
| 7. | නු/හින්නපිටිය විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 8. | නු/පතන විද්‍යාලයය | ... | වීදුරු ජනෙල් දැමීම |
| 9. | නු/ධර්මපාල විද්‍යාලයය | ... | ගුරු නිවාසය |
| 10. | නු/ආගරපතන විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 11. | නු/උඩවත්ත විද්‍යාලයය | ... | වහල අලුත්වැඩියාව |
| 12. | නු/ඇකිරිය විද්‍යාලයය | ... | හදිසි අලුත්වැඩියාව |
| 13. | නු/හඳවල පිටිය විද්‍යාලයය | ... | වහල අලුත්වැඩියාව |
| 14. | නු/කලුකැලේ විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 15. | නු/රහතුන්ගොඩ විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 16. | නු/පේරවැල්ල විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 17. | නු/හඟුරන්කෙත සී. සී. විද්‍යාලයය | ... | අලුත්වැඩියාව |
| 18. | නු/බෝගහ වත්ත විද්‍යාලයය | ... | වීදුරු ජනෙල් දැමීම |
| 19. | නු/සෙනරත්පුර විද්‍යාලයය | ... | වැසිකිළියක් තැනීම |
| 20. | නු/පන්මූර් දෙමළ විද්‍යාලයය | ... | වැසිකිළියක් තැනීම |
| 21. | මහ/ගිණිගත්හේන මධ්‍ය මහා විද්‍යාලයය | | අලුත්වැඩියාව |

අංක 1.—සංලක්ෂාය :

නු = නුවරඑළිය දිස්ත්‍රික්කය
බ = බදුල්ල දිස්ත්‍රික්කය
මහ = මහනුවර දිස්ත්‍රික්කය.

2. අවශ්‍ය ලියා පදිංචි කිරීම—

| | |
|---|---|
| අංක 1 සහ 2 | රු. 45,000 හෝ ඊට වැඩි |
| අංක 3 පමණක් | රු. 40,000 හෝ ඊට වැඩි |
| අංක 4 සිට 7 දක්වා | රු. 30,000 හෝ ඊට වැඩි |
| අංක 9 සිට 15 දක්වා | රු. 20,000 හෝ ඊට වැඩි |
| අංක 16 සහ 21 | රු. 15,000 හෝ ඊට වැඩි |
| අංක 8 සහ 17 සිට 18 දක්වා | රු. 10,000 හෝ ඊට වැඩි |
| අංක 19 සිට 20 දක්වා | රු. 5,000 හෝ ඊට වැඩි |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ඉහත අංක 2 හි සඳහන් ගණනට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවනට 1970 මාර්තු මස 12 වැනි බ්‍රහස්පතින්ද දහවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ–2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි අංකයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීමට අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. පූර්වෝක්ත 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක කින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි කර නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ කායඵාල සහකාර වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1970 මාර්තු මස 13 වැනි සිකුරාදා පෙ.ව. 10.30 ට නුවරඑළියේ අධ්‍යාපන කායඵාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවනට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර්පත් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කායඵාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවනගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

ඒ. ජී. ඒ. මෙන්දිස්,
නුවරඑළිය ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි මස 10 වන දින,
නුවරඑළියේ, අධ්‍යාපන කාර්යාලයේ දී.

2–743—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම් මට හෝ තමා ටෙන්. පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිළධාරියාට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙ කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳ තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තිෙ දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී " ස එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවටද යන්න පැහැදිලිව සඳහන් කළ යුතු මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කා ලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිද කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10.00 ට ටෙන් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑ ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජ යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණ මොනම හේතුවක් නිසා හෝ ඒ කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු, මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරො වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට, ගබඩා, විදුලි බලය, ජල ආදිය පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආද පාලක නිළධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුවරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු විෂබීජ නැති කිරීම සඳ වෙනම ස්ථානයකට ගෙන යැමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යැමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

1970 පෙබරවාරි මස 11 වැනි දින,
කො.රෝ.ම. අධිකාරී කාර්යාලය,
මහ රෝහල, කොළඹ.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩල අධිකා

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කැලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| කොළඹ මහ රෝහල—සියලුම ගෙවන වාට්ටු හා අලුත් ගොඩනැගිල්ලේ නොගෙවන වාට්ටු | 100 ... | 400 ... | 4 ... | 8,500 ... | 1970.3.23 වැනි දින පෙරව 10.00 ට |

2–702—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස් සී. 2/62-69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශල්‍ය උපකරණ ජීවාණුහරණ ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ශල්‍ය උපකරණ ජීවාණුහරණ ආදිය සැපයීම සඳහා පහත සඳහන් ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගොස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ, රජින විදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අප්‍රේල් 20 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(ii) I වැනි ඡේදයේ (iv) වැනි උප ඡේදයේ සඳහන් රා යන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණ

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වල අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්ත ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන් පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩ නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ය රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා වෙ ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දි යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නිය ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන් කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුව

කොළඹ, 3. 2. 70.

2–593—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම් හි නි.මි.යෝ.ක්‍ර. ගබඩා තැනීම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම් හි නි.මි.යෝ.ක්‍ර. ගබඩා තැනීම සඳහා 1970 මාර්තු මස 13 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍ර වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 60, දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1970 මාර්තු මස 12 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම එවීමට හැකි වන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබාගත හැකිය.

වි. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 පෙබරවාරි මස 20 වෙනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

2-705—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි.මි.යෝ.ක්‍ර. ගබඩා සඳහා 4' × 4' ප්‍රමාණයේ ලී තට්ටු සෑදීම, සැපයීම සහ ගෙනවුත් භාරදීම**

දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සැලැස්ම අනුව ලී තට්ටු සාදා ගෙනවුත් භාරදීම සඳහා 1969 මාර්තු 13 වැනි දින ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරනු ලබන උපලේඛනයේ සඳහන්ව ඇති පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නොයෙකුත් නි.මි.යෝ.ක්‍ර. ගබඩාවට මෙම ලී තට්ටු භාරදිය යුතුය.

2. රුපියල් 250 (රුපියල් දෙසිය පණහක්) තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කරනු ලබන රු. 30,000 (රුපියල් තිස්දහ) ක හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සහ වඩු කර්මාන්ත වැඩ සඳහා ලියා පදිංචි වූ රජයේ අනුමත කොන්ත්‍රාත් කරුවනට 1970 මාර්තු 12 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. රුපියල් 1,00,000 කට හෝ ඊට වැඩි වැඩක් භාරගත හැකි බවට ප්‍රදේශයේ ස.සං.උ. කොමසාරිස් ගෙන් ලබා ගන්නා ලද ලිපියක් ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි වඩු කර්මාන්ත සමුපකාර සමිතිවලටද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරනු ලබන අය විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනයට හා වේලාවට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එසේ කළ යුතුය.

4. මෙම සැපයීම් 1970.8.31 පෙර අවසන් කළ යුතුය. සැපයිය යුතු ප්‍රමාණය 2,000 කි.

5. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගැනීම මැනවි.

වි. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 පෙබරවාරි 20 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

2-704—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා පෙර පෝය දිනයක් බැවින් 1970.1.29 දින ගැසට් පත්‍රයෙහි පළ වූ වතුර පොම්ප සැපයීමේ ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය, 1970.2.20 දින සිට 1970.2.23 වැනි සඳුදා අ. භා. 2.30 දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

වී. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1970.2.13 දින.

2-706—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා පෙර පෝය දිනයක් බැවින් 1970.2.13 වැනි දින ගැසට් පතෙහි පළවූ දැන්වීම අනුව දෙපාර්තමේන්තුවට හිස්ගෝනි සැපයීමේ ටෙන්ඩර් අවසාන දිනය 1970.2.23 වැනි සඳුදා අ. භා. 2.30 වනතෙක් දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

වි. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 7.
1970 පෙබරවාරි මස 13 වෙනි දින.

2-707—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට කොළඹ සහ ත්‍රිකුණාමලයේ වරාය වලින් බඩු ඉවත්කොට ඉදිරිපත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1970 පෙබරවාරි 25 දින අ. භා. 2 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් කෙරේ.

අයැදුම් කළ විට ටෙන්ඩර් ආකෘතිපත් සහ අනිකුත් විස්තර ලබාගත හැකිවේ.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2.
1970 පෙබරවාරි 8 දින.

2-778—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

යොමුව : පීඑස්සී 2/13/E

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බැන්ඩේජස් ක්‍රෙප් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් බැන්ඩේජස් ක්‍රෙප් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.—

(i) මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම් ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අප්‍රියෙල් 3 සිකුරාදා දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත් ;

(ii) 1 වැනි ඡේදයේ IV වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනාට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ.

### අදල උපලේඛනය

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing repuired* |
|---|---|---|---|
| 1 | Bandages Crepe B.P.C. 3″ × 3 yards (unstretched) and 3″ × 5 yards (stretched) .. | 8,800 dozen .. | In any convenient packing |

2–572—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්බී 2/63/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සිරින්ජර සහ ඉඳිකටු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සිරින්ජර සහ ඉඳිකටු සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයන් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ, රජින වීදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අප්‍රියෙල් මස 3 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලින් ;

(ii) 1 වැනි ඡේදයේ (IV) වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඔස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 පෙබරවාරි මස 3 වැනි දින,
කොළඹ.

2–592—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## අදාල උපලේඛනය

## SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|---|
| 1 .. | All glass Luer Lock Hypodermic Syringes 2 cc graduated 1/2 cc and minims | | 850 dozen .. | Each in a box and one dozen per carton |
| 2 .. | All glass Syringes 1 cc (with blue plunger) graduated in 1/100 cc and minims | | 12 dozen .. | do. |
| 3 .. | All glass infusion syringes Luer Lock similar to Kaufman Syringes B.D. Cat. K606M | | 12 dozen .. | do. |
| 4 .. | All glass Luer Lock Hypodermic Syringes 5 cc graduated 1/5 cc and minims | | 300 dozen .. | do. |
| 5 .. | All glass Luer Lock Hypodermic Syringes 20 cc graduated 1 cc | | 100 dozen .. | do. |
| 6 .. | All glass Luer Lock Hypodermic Syringes 10 cc graduated 1/5 cc | | 100 dozen .. | do. |
| 7 .. | All glass Luer Lock Hypodermic Syringes 50 cc with accentric nozzle graduated 5 cc | | 200 dozen .. | do. |
| 8 .. | Hypodermic Luer Lock Needles with regular bevel 25 gauge 1" long to fit Hypodermic Luer Lock Syringes | | 300 dozen .. | One dozen in a box and one gross per carton |
| 9 .. | Ditto, 24 gauge 1" long | do .. | 500 dozen .. | do. |
| 10 .. | Ditto, 23 gauge 1" long | do .. | 1,500 dozen .. | do. |
| 11 .. | Ditto, 23 gauge 1½' long | do .. | 1,500 dozen .. | do. |
| 12 .. | Ditto, 22 gauge 1½" long | do .. | 1,500 dozen .. | do. |
| 13 .. | Ditto, 21 gauge 1½" long | do .. | 1,500 dozen .. | do. |
| 14 .. | Ditto, 20 gauge 1½" long | do .. | 1.500 dozen .. | do. |
| 15 .. | Ditto, 19 gauge 1½" long | do .. | 2,000 dozen .. | do. |
| 16 .. | Ditto, 18 gauge 1½" long | do .. | 2,000 dozen .. | do. |
| 17 .. | Ditto, 17 gauge 4" | do .. | 200 dozen .. | do. |
| 18 .. | Ditto, 15 gauge 5" | do .. | 200 dozen .. | do. |

2-592—70.2 20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### සේවයට අයෝග්‍ය මෝටර් රථ මිලයට ගැනීම

ලංකාණ්ඩුවේ අංක 14.889 හා 1970.1.16 දින ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයේ 95 වෙනි පිටුවේ ප්‍රසිද්ධ කර තිබෙන ටෙන්ඩර් දැන්වීම වැරදීමකින් ඔස්ටින් හිලන් රථය සි. වී. 3387 නමින් පලකර තිබේ. නමුත් සේවයට අයෝග්‍ය එම මෝටර් රථය සුපවීලිප් සී.වී. 3387 රථයක් බව මෙයින් දන්වමි.

වෛද්‍ය එච්. සී. ඉගෝමස්,
සෞඛ්‍ය සේවා අධිකාරි කොළඹ.

89 කින්සි පාර,
කොළඹ.
1970.2.10.

2-644—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### ඇලුමිනියම් බෝතල් මූඩි ග්‍රෝස් 2,75,000 ක් සැපයීම

ඇලුමිනියම් බෝතල් මූඩි ග්‍රෝස් 2,75,000 ක් සැපයීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 25 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1970 මැයි 25 වැනි දින පෙ. ව. 10 ට කොළඹ 7 ටොරින්ටන් චතුරශ්‍රයේ, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1970 මැයි මස 24 වැනි දින දවල් 12 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් කොළඹ 7, සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

5. සෑම ටෙන්ඩරයක්ම පිටපත් 2 කින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "බෝතල් මූඩි සැපයීමේ ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

6. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර් පත්‍ර එවිය හැක. කිසියම් ටෙන්ඩර් කරුවෙක් ස්වකීය ටෙන්ඩරය තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින්, ස්වදේශ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදිය හැක. එබඳු අවස්ථාවලදී ඉහත 5 වන ඡේදයේ සඳහන් විස්තර ද ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය, සෑම විටම මුද්‍රා තැබිය යුතුය.

7. වැඩි විස්තර සුරාබදු කොමසාරිස් වෙතින් ලබාගත හැක.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970.2.5 දින.

2–615—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහිවූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් 1970-71 යන වර්ෂයන්හි ටයර් පිරවීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1970 මාර්තු 20 වෙනි දින පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නියමිත ලෙස ලියා. අනු පිටපතකින් ද යුතුව එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 ස්ථානයෙහිවූ මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තබා ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය මාගේ කාර්යාලය වෙත 1970 ක්වූ මාර්තු මස 19 වෙනි දින පෙරවරු 12 ට පෙර ඉදිරිපත් කල විටය. වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

2–461—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

**පාවිච්චි කරන ලද ගර්හිත ඇන්ජින් විකිණීම—අපහරණ අංගනය, වේරහැර, බොරලැස් ගමුව**

වේරහැර, බොරලැස්ගමුවේ, ලං.ග.ම. අපහරණ අංගනයේ තිබෙන පාවිච්චි කරන ලද ගර්හිත ඇන්ජින් මිළයට ගෙන හැරගෙන යාම සඳහා එවනු ලබන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.3.20 දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

බෙඩ්ෆඩ්, පර්කින්ස්, ඇල්බියන්, ඒ.ඊ.සී., ෆෝර්ඩ් වී 8, ඩොජ්, ගයි, ගාර්ඩිනර්, අයි.එච්.ටී/ලේලන්ඩ්, හැවර්ලේ ආදී වර්ගවල ඇන්ජින් මේ තොගයට අයත් වේ.

ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දිනයට පෙර දින දවල් 12 වනතෙක් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර පෝර්මය පිටපත් දෙකකින් යුක්ත කොට මුද්‍රා තබා එවිය යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලං.ග.ම., ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර තැන්පත් මුදල වශයෙන් මුදලින් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුල වේරහැර අපහරණ අංගණයේදී මෙම ඇන්ජින් පරීක්ෂා කළ හැකිය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර, කොළඹ 5.

2–698—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

**ගාලු-හම්බන්තොට පාරේ 111 කණුව අසලට සහ ලූනාවේ කැතරින් ආයසී රිය මගට කළුගල් සැපයීම**

ගාලු-හම්බන්තොට පාරේ 111 සැතැපුම් කණුව අසලට කුට්ටිගල් 1,000 ක් සහ සක්ක ගල් කියුබ් 200 ක් සැපයීම සඳහා 1970.2.5 දා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සහ ලූනාවේ, කැතරින් ආයසී රිය මගට කුට්ටි ගල් 2,000 ක් සහ සක්ක ගල් කියුබ් 50 ක් සැපයීම සඳහා 1970.2.13 දා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනය සම්බන්ධයෙන් ටෙන්ඩර්කරුවන් කළුගල් පුපුරවීමට හා ඒවා ප්‍රවාහනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ හා වාහන ආදිය තමන් සතුව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකි විය යුතු අතර, දැනටමත් විශාල කොන්ත්‍රාත්තු යටතේ කුට්ටි ගල් සපයා තම හැකියාවන් තහවුරු කර සිටිය යුතුය.

ගාලු-හම්බන්තොට පාරේ 111 වෙනි සැතපුම් කණුවට කුට්ටි ගල් 1,000 ක් සහ සක්ක ගල් කියුබ් 200 ක් සැපයීම පිළිබඳ ඉහත සඳහන් ටෙන්ඩරයේ ටෙන්ඩර් පත් භාර ගැනීමේ කාලය සහ ටෙන්ඩර්පත් නිකුත් කිරීමේ කාලය පිළිවෙලින් 1970.3.11 දා පස්වරු 2.30 දක්වා සහ 1970.3.9 දා දහවල් 12 දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1970.2.20,
කොළඹ, වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

2–685—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහා මාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ගවල මතුපිට සකස් කිරීම සඳහා අවශ්‍ය 2″ සහ ¾″ කලුගල් සැපයීම (පළමු පියවර) සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 මාර්තු මස 4 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් බාරගනු ලැබේ.

2. කොළඹ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත් වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනුපිටපතකින්ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුලුවන.

3. රුපියල් 50,000 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත්කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතම් වීදියේ පිහිටි මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු බටහිර කොට්ඨාශය,
(මහා මාර්ග).

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 පෙබරවාරි 12.

2–796—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහා මාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ගවල මතුපිට සකස් කිරීම සඳහා අවශ්‍ය 2″ සහ ¾″ කලුගල් සැපයීම (දෙවන පියවර) සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 මාර්තු මස 4 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් බාරගනු ලැබේ.

2. කොළඹ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත් වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනුපිටපතකින්ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුලුවන.

3. රුපියල් 50,000 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත්කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතම් වීදියේ පිහිටි මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු බටහිර කොට්ඨාශය,
(මහා මාර්ග).

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,

2–797—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**1969.10.1 දින සිට 1969.12.31 දින දක්වා වූ කාල සීමාව ඇතුලත දෙපාර්තමේන්තු ගැනුම්පත් මණ්ඩලය මගින් පිළිගන්නා ලද ගැනුම්පත් පිළිබඳ ප්‍රකාශනයයි**

| | වැඩ විස්තරය | ලැබී තිබුණු මුළු ගැනුම් පත් ගණන | තෝරාගනු ලැබූ ගැනුම්කරුගේ නම | ගැනුම් පතේ වටිනාකම රු. ශ. | පිළිගත් දිනය |
|---|---|---|---|---|---|
| 1. | යටියන්තොට, බලවේග පෙහෙකම් වැඩපොලක් තැනීම ... | 1 ... | ඒ. ඇම්. අබේරත්න සහ සමාගම... | 1,66,977 60 ... | 1969.11. 7 |
| 2. | දඹුල්ල රජයේ රෝහලේ ඇඳන් 75ක් සඳහා මුළුතැන් ගෙයක් තැනීම | 3 ... | ඇස්. ඇම්. සී. ද සිල්වා මහතා ... | 1,13,276 50 ... | 1969.11.27 |
| 3. | කලවානේ මැදි බෙහෙත් හලක් සහ මෘත ශරීරාගාරයක් තැනීම ... | 1 ... | කේ. ඩී. ද සිල්වා මහතා ... | 71,631 10 ... | 1969.12.15 |
| 4. | කල්තොට රජයේ රෝහලේ ඇඳන් 12ක සැහැල්ලු වාට්ටුවක් තැනීම | 1 ... | වී. ඇස්. පීරිස් මහතා ... | 96,360 66 ... | 1969.12.15 |
| 5. | වැල්ලවාය රජයේ රෝහලේ ඇඳන් 14ක මාතෘ වාට්ටුවක් තැනීම ... | 1 ... | වී. රත්නසිංහම් මහතා ... | 1,20,608 43 ... | 1969.12.17 |

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
දෙපාර්තමේන්තු ගැනුම්පත් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1970 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දී ය.

2–588—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## තීන්ත සැපයීමේ ටෙන්ඩරය—පිය වූ දිනය : 1969.7.15 දින

| විෂය අංකය | සැපයීමේ හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිල ගණන් රු. ශ. | |
|---|---|---|---|---|---|
| 1. | ලී වල පිටත හා ඇතුලත ගෑම සඳහා මිශ්‍ර කරන ලද පින්තාරු තීන්ත. තද කොළ පාට, ඉම්. ගැලුම් 1 ටින්වලින් | 9 යි ... | සී/ස. ඩී. කේ. මෝඩි සහ සමාගම ... | 24 22 | ඉම්. ගැලුමක් |
| 2. | එම වොක්ලට්, ඉම්. ගැලුම් 1 ටින් වලින් ... | | එම ... | 24 22 | එම |
| 3. | එම රතුපාට, ඉම්. ගැලුම් 1 ටින්වලින් ... | | එම ... | 24 22 | එම |
| 4. | එම සුදුපාට, ඉම්. ගැලුම් 5 ටින්වලින් ... | | එම ... | 24 22 | එම |
| 5. | එම සුදුපාට, ඉම්. ගැලුම 1 ටින් වලින් ... | | එම ... | 24 22 | එම |
| 6. | එම ක්‍රීම් පාට, ඉම්. ගැලුම් 1 ටින් වලින් ... | | එම ... | 24 22 | එම |
| 7. | එම කහපාට, ඉම්. ගැලුම් 1 ටින් වලින් ... | | එම ... | 24 22 | එම |
| 8. | මිශ්‍ර කරන ලද ඇනමල් පින්තාරු තීන්ත, ඉම්පීරියල්' පයින්ට් 1/2 ටින් වලින්—කළු පාට | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පොල්ට් (ලංකා) ... | 2 45 | පයින්ට් 1/2 ටින් එකක් |
| 9. | එම නිල් පාට ... ... | | බී. සී. බයර්ස් ... ... | 3 0 | එම |
| 10. | එම කොළපාට ... ... | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පොල්ට් (ලංකා) ... | 2 75 | එම |
| 11. | එම වර්මිලියන් පාට ... ... | | බී. සී. බයර්ස් ... ... | 3 0 | එම |
| 12. | එම සුදුපාට ... ... | | රියෝ ජේන්ට් ඉන්ඩස්ට්‍රීස් ... | 2 40 | එම |
| 13. | එම කහපාට ... ... | | බී. සී. බයර්ස් ... ... | 3 0 | එම |
| 14. | එම ක්‍රීම් පාට ... ... | | එම ... | 3 0 | එම |
| 15. | එම අළු පාට ... ... | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පොල්ට් (ලංකා) ... | 2 75 | එම |
| 16. | ලැකර් ඇණමල් පින්තාරු තීන්ත ඉම්පීරියල් පයින්ට් 1 කේ ටින්වලින්—සුදු පාට | | සී/ස. ඩී. කේ. මෝඩි සහ සමාගම ... | 4 25 | ඉම්. පයින්ට් 1 ටින් එකක් |
| 17. | එම කළුපාට ... ... | | සවුතා කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ... | 2 50 | එම |
| 18. | එම ක්‍රීම් පාට ... ... | | සී/ස. ඩී. කේ. මෝඩි සහ සමාගම ... | 4 25 | එම |
| 19. | එම නිල් පාට ... ... | | එම ... | 4 25 | එම |
| 20. | එම කහපාට ... ... | | එම ... | 4 25 | එම |
| 21. | එම අළුපාට ... ... | | එම ... | 4 25 | එම |
| 22. | මිශ්‍ර කරන ලද ඇණමල් පින්තාරු තීන්ත ඉම්පීරියල් ගැලුම් 1 ටින් වලින් —සුදුපාට | | බී. සී. බයර්ස් ... ... | 32 0 | ඉම්. ගැලුම් 1 ටින් එකක් |
| 23. | එම කළුපාට ... ... | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පෝල්ට් (ලංකා) ... | 28 75 | එම |
| 24. | එම ක්‍රීම් පාට ... ... | | බී. සී. බයර්ස් ... ... | 32 0 | එම |
| 25. | එම නිල්පාට ... ... | | එම ... | 32 0 | එම |
| 26. | එම කොළපාට ... ... | | එම ... ... | 34 0 | එම |
| 27. | එම අළුපාට ... ... | | එම ... ... | 32 0 | එම |
| 28. | වානේවල ගෑම සඳහා මිශ්‍ර කරන ලද මල නිවාරක පින්තාරු තීන්ත කළුපාට, ඉම්පීරියල් ගැලුම් 1 ටින්වලින් | | බී. සී. බයර්ස් ... ... | 23 0 | එම |
| 29. | එම ගැලුම් 5 ටින් වලින් ... ... | | එම ... | 22 50 | එම |
| 30. | එම කොළපාට, ඉම්. ගැලන් 1 ටින් වලින් ... | | එම ... ... | 24 0 | එම |
| 31. | එම රතු ඔක්ස්අයිඩ් පාට, ඉම්.ගැලුම් 1 ටින්වලින් | | එම ... | 22 50 | එම |
| 32. | වානේවල ගෑම සඳහා මිශ්‍ර කරන ලද මලනිවාරක පින්තාරු තීන්ත සිග්නල් රතු, ඉම්. ගැලන් 1 ටින්වලින් | | ඩී. කේ. මෝඩි සහ සමාගම ... | 24 22 | එම |
| 33. | එම සුදු පාට ... ... | | එම ... | 24 22 | එම |
| 34. | එම සුදු පාට, ඉම්. ගැලුම් 5 ටින්වලින් ... | | එම ... | 24 22 | ඉම්. ගැලුමක් |
| 35. | බිටුමිනස් සොලූයිෂන් කළුපාට, ඉම්. ගැලුම් 5 ටින්වලින් | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පෝල්ට් (ලංකා) ... | 4 88 | එම |
| 36. | එම ... 1 ටින් වලින් | | එම ... | 5 75 | එම |
| 37. | එම රතුපාට, ඉම්. ගැලුම් 5 ටින්වලින් ... | | එම ... | 11 12 | එම |
| 38. | එම රතු පාට, ඉම්. ගැ. 1 ටින්වලින් ... | | එම ... | 12 50 | එම |
| 39. | එම අළුපාට, ඉම්. ගැලුම් 5 ටින් වලින් ... | | ඩී. කේ. මෝඩි සහ සමාගම ... | 22 95 | එම |
| 40. | එම අළු පාට, ඉම්. ගැලුම් 1 ටින්වලින් ... | | එම ... | 22 95 | එම |
| 41. | ඇළුමිනියම් පින්තාරු තීන්ත ද්විත්ව භාජන වල මීඩියම් රු. 8.14 සහ පිග්මන්ට් රු. 2.125 | | සී/ස. ඉන්ඩස්ට්‍රියල් ඇස්පෝල්ට් (ලංකා) ... | 22 0 | එම |
| 42. | කෝපාල් වාර්නිෂ් පිටත පාවිච්චිය සඳහා ඉම්. ගැලුම් 1 ටින්වලින් | | බී. සී. බයර්ස් ... ... | 26 0 | එම |

සැ. ඕ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 පෙබරවාරි 20 දින,
කොළඹ දී ය.

2–742—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## කොළඹ මහාරෝහල—ප්‍රසිද්ධ වෙන්දේසියක්

පාවිච්චියට ගතනොහැකි පහත සඳහන් ද්‍රව්‍යයන් 1970 මාර්තු මස 20 වැනි සිකුරාදා ප. ව. 2 සිට කොළඹ, මහා රෝහලේ ප්‍රධාන ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. ජයග්‍රාහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදී ම මුළු මුදලම ගෙවා එම ද්‍රව්‍යයන් ඉවතට ගෙනයා යුතුය.

2. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂේප කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට බලය ඇත.

3. මෙම ද්‍රව්‍යයන් රෝහලේ ගබඩාවේදී 1970 මාර්තු මස 20 වැනි සිකුරාදා පෙ. ව. 9 සිට ප. ව. 1 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

4. වැඩි විස්තර කොළඹ, මහා රෝහලේ වෛද්‍ය අධිකාරි තැනගෙන් දැනගැනීමට පුළුවන.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ, රෝහල් මණ්ඩලයේ අධිකාරී.

1969.12.6 වැනි දින,
කොළඹ, මහාරෝහල.

### ද්‍රව්‍ය ලේඛනය

| | | |
|---|---|---|
| 1. | ටයර් මෝටර් රථ සඳහා 550 × 16 ... ... | [illegible] |
| 2. | ටයර් මෝටර් රථ සඳහා 650 × 18 ... ... | 2 |
| 3. | ටියුබ් මෝටර් රථ සඳහා 650 × 18 ... ... | 2 |
| 4. | ටියුබ් මෝටර් රථ සඳහා 640 × 15 ... ... | 7 |
| 5. | ටියුබ් මෝටර් රථ සඳහා 550 × 16 ... ... | 4 |
| 6. | බැටරි මෝටර්රථ සඳහා ... ... | 1 |
| 7. | බිම ඔපදමන යන්ත්‍ර (විදුලිමය) ... ... | 4 |
| 8. | හැඩලය සහිත මොප්ස් ... ... | 22 |
| 9. | සීනු (විශාල) ... ... | 1 |
| 10. | කුඩා ඇඳන් ... ... | 1 |
| 11. | බෙහෙත් ද්‍රව්‍ය තබන පෙට්ටි (වීදුරු මූණසහිත) ... | 1 |
| 12. | ස්ටූම (ලී) ... ... | 1 |
| 13. | මේස ... ... | 1 |
| 14. | ලී පෙට්ටි (ලියුම් සඳහා) ... ... | 1 |
| 15. | තණ කපන යන්ත්‍ර ... ... | 1 |
| 16. | යකඩ ඇඳන් ... ... | 1 |
| 17. | ටෙරසෝ මේස ... ... | 1 |
| 18. | කාණු පිසදමන බුරුසු ... ... | 2 |
| 19. | හිස් බිස්කොතුටින් (රු. 10) ... ... | 23 |
| 20. | හිස් දොඩම්යුෂ බෝතල ... ... | 400 |
| 21. | නොයෙක් වර්ගයේ හිස්ටින් ... ... | 10 |
| 22. | හිස් සින්ච් බෝතල ... ... | 1,500 |

2–649—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියයි

බයිසිකල් සීට්, තුවා, තීන්ත පිරවුම්, සනීපාරක්ෂක උපකරණ, වි කොටන යන්ත්‍ර, තැටි සහ කොටස්, බැනියම්, රසකරන සාර, තඹ කම්බි, මෝටර් රථ අමතර කොටස්, පොල් තෙල් ටින්, කරදමුංගු. මහන මැෂින්, ගෑස් මැන්ටල්, ඉලෙක්ට්‍රික් ස්විචස්, විදුලි සැරසිලි සැට්, වෝල්ටේජ් රෙගුයුලේටර්. අංක මුද්‍රා මැෂින්, ෂිප් පාස්ටනර්ස්, මෝටර් කාර් ටයර්, මෝටර් කාර් ටියුබ්, ඉලැක්ට්‍රොට්ස්, නයිලෝන් මාලු දැල්, කපුනූල්. යතුරු දම්වැල්, තේ, විදිලි බුබුලු, ශීත කරන. මැනිලා ලනු (සිලින්ග), ඈව්ච්චි කරන ලද සූට්කේස් සහ ට්‍රන්ක් පෙට්ටි, කරුංකා, ඊයම් පොලු, විදුලි පන්දම්, ට්‍රාන්සිස්ටර් බැටරි. හෝර්ලික්ස්, මසන ලද ලෝම සූට්, ලෝම නූල් ෂිවර්. පදම් කරන ලද කිඹුල් සම්, කොපිහම්, වොලිබෝල් බ්ලැඩර්. වීදුරු තඹලේරු. කුඩ. ලෝහ කියත් තල, ඉබි යතුරු, පොලිතින් බෑග්, විදුලි ස්තිරික්ක. ටයිපපිට, අත් ඔර්ලෝසු, ට්‍රාන්සිස්ටර් රේඩියෝ. පා පැදි. 'ජ්ලිමන්' වගීයේ මෝටර් රථ ඇන්ජිමක්, ලදරු (බ්ලැන්කට්) කම්බිලි. ක්ලොරපෝම් ටින්, පී. වී. පී. ග්ලොව්ස්. දැලි පිහිතල, සෙල්ලම් අහස් යානා වල ට වීනච්චට්ටි පොලු සහ වානේ පිහි. කෙලිබඩු කාට්‍රිජ් ගැල්වනයිස් ඇත සහ මුරිච්චි, පෙරදිග මේස ලාම්පුවක්, (බැටරි) යකඩ මුරිච්චි, පිත්තල ආලේප කරන ලද වානේ සරනේරු, ලීවලට යොදන නිකල් ආලේපනය කළ ඉස්කුරුප්පු ඇන, නිකල් ආලේප කරන ලද දොරවලින් බලන කච්ලු, විදිලි ඔරලෝසු, තෝනාවරුන් පාවහන්, විවිධ භාණ්ඩයන්ගේ සැම්පල් යනාදිය සමන්විත අල් අහිමි කරන ලද භාණ්ඩයන් 1970 පෙබරවාරි මස 24, 25, 27 සහ 28 යන දිනයන්හි සෑම දිනකම පෙරවරු 9 ට පට ගෙන කොළඹ 1, රේගුවේ, මගීන්ගේ පර්යන්ත වේදිකා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ කොළඹ, රේගුවේ මගීන්ගේ පර්යන්ත වේදික දී 1970 පෙබරවාරි මස 23 වැනි දින පෙරවරු 9.30 සිට වෙන්දේ ඇරඹෙන තෙක් ප්‍රදර්ශනය සඳහා තබනු ඇත.

වැඩි විස්තර රේගුවේ ප්‍රධාන කාර්යාලය, දිගු කාමරය, විම කවුන්ටරය, ගුවන් බඩු කාර්යාලය, මගීන්ගේ බඩු කාර්යාල නිවාරණ කාර්යාලය, අපනයන කාර්යාලය, තැපැල් පාර්සල් කා ලය සහ ප්‍රධාන ලිපිකරු කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන රේගු අයක

මගේ අංකය : පී. ඕ/විකිණීම්/1/70
කොළඹ. රේගු දෙපාර්තමේන්තුවේ,
නිවාරණ කාර්යාලයේ දී ය.
1970 පෙබරවාරි මස 11 වැනි දින.

2–684—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

### අනුමතිය සඳහා ඉදිරිපත් කරන පාසල් පොත්

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් නිකුත් කෙරෙන 1970 වර්ෂය වෙනුවෙන් අනුමත කරන ලද සම්පූර්ණ පොත් ලැයිස්තුවට ඇතුළත් කරවා ගැනීමට බලාපොරොත්තු වන 1970.12.31 වැනි දින අනුමැතිය අවසාන වන සෑම පොතක්ම 1970.3.31 වැනි දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සැලැස් විය යුතු බව ග්‍රන්ථ කර්තෘවරුන් හා ප්‍රකාශකයන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. යම්කිසි වර්ෂයක් අවසානයේදී අනුමැතිය අවසන් වන පොත්වල අනුමතිය අළුත් කරවා ගැනීමට බලාපොරොත්තු වන ග්‍රන්ථ කර්තෘවරුන් සහ ප්‍රකාශකයින් මාර්තු මස 31 වැනි දිනට පෙර ඒ පොත් මෙම කාර්යාලයට එවිය යුතුය. අනුමතිය අළුත් කිරීමට පෙර සංශෝධනය කළ යුතු බැව් දන්වා ඇති පොත් සංශෝධනය කොට එවීමට වග බලා ගත යුතුය.

2. අනුමතිය අළුත් කරවා ගැනීමට මාර්තු මස 31 වැනි දිනට පසුව ඉදිරිපත් කරනු ලබන පොත් වර්ෂය අවසානයේ නිකුත් කරනු ලබන ලැයිස්තුවට ඇතුළත් නොවීමට ඉඩ ඇති බව විශේෂයෙන්ම නිවේදනය කිරීමට සිදුවී ඇත.

3. නියමිත දිනට පෙර ඉදිපරිත් කළ පොතක් සඳහා වුව යම් කිසි නොවැළැක්විය හැකි හේතුවක් නිසා අනුමතිය දීම වුව හොත්, එම පොත මෙම ලැයිස්තුවට ඇතුළත් නොවීම පිළිබ මණ්ඩලය වග නොකියයි.

4. ඊළඟ වර්ෂයට පාසල් පොත් නියම කරනු ලබන්නේ වර අවසානයේ නිකුත් කරනු ලබන සම්පූර්ණ පන්ති පොත් ලැයිස් අනුව හෙයින් නියමිත දිනට පොත් ඉදිරිපත් කොට තමන් පොත් පිළිබඳ අනුමතිය ලැබෙන බවට වගබලා ගන්නා හැටි ග්‍රන්ථ කර්තෘවරුන් හා ප්‍රකාශකයින් වෙත අවධාරණයෙන් මෙ කර සිටිමි.

සෝමරත්න විජයසිංහ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩල
ලේකම්.

1970 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේදී ය.

2–617—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**පිල්වලින් යුත් "තිව්ස් ප්‍රින්ට්"**

පිල් වලින් යුත් "තිව්ස් ප්‍රින්ට්" ආනයනය, ආනයන බලපත්‍ර යටතට ගෙන ඇත. නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය එකම ආනයනකරුය.

පිල්වලින් යුත් "තිව්ස් ප්‍රින්ට්" සැපයීම සඳහා සංයුක්ත මණ්ඩලය සමග ලියා පදිංචි වන ලෙස මූලික සැපයුම් කරුවන් ගෙන්, නිෂ්පාදකයින්ගෙන් හා නියෝජිතයින්ගෙන් කරුණාවෙන් ඉල්ලමු.

ලියාපදිංචි වීම සඳහා අයැදුම් පත් මූලික සැපයුම්කරුවන්ගේ; නිෂ්පාදකයින්ගේ නම් සහ කේබල් ලිපිනයන් සඳහන් කොට කොළඹ, යුනියන් පෙදෙසේ, අංක 356 හි, නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමට එවිය යුතුය.

අයැදුම් කළ විට විශේෂ විස්තර ගැන සියලු තොරතුරු සපයනු ලැබේ.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

1970 පෙබරවාරි 3 දින.

2–655—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු—ඇබෑර්තු

( 260 පිට හා සම්බන්ධයි. )

### අධිකරණ සේවා කොමිෂන් සභාව

**නීන්දගම් ඉඩම් මණ්ඩලයට සභාපතිවරයෙකු හා සාමාජිකයින් පත් කිරීම**

1968 අංක 30 දරණ නින්දගම් ඉඩම් පණත යටතේ "නින්දගම් ඉඩම් මණ්ඩලයට" සභාපතිවරයෙකු හා සාමාජිකයින් 14 දෙනෙකු අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ළඟදීම පත් කරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන්, විශ්‍රාම ලැබූ අධිකරණ සේවා නිලධාරීන් ගෙන්, උඩරට පළාත්හි අවුරුදු 15 ට නොඅඩු කාලයක් සේවය කර ඇති නීතිඥයින්ගෙන් හා උඩරට පළාත්හි ඉඩම් නිරවුල් කිරීමේ හෝ ප්‍රාදේශීය ඉඩම් පරිපාලනයෙහි හෝ මණ්ඩලීක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති පුද්ගලයින්ගෙන් ද ලැබෙන ලිඛිත අයදුම් පත් සලකා බලනු ලැබේ.

2. අයදුම්කරුවන් වයස අවුරුදු 50ට නොඅඩුවූත්, 65ට නොවැඩි වූත්, සිංහල මනා දැනීමක් ඇත්තාවූත් පුද්ගලයන් විය යුතුය.

3. සෑම අයදුම්කරුවෙකුම යට දැක්වෙන පරිදි ප්‍රකාශ කළ යුතුය.

"මට හෝ මාගේ පවුලේ කිසිදු සාමාජිකයෙකුට හෝ නින්දගම් ඉඩමක අයිතිවාසිකමක්, හිමිකමක් හෝ කිසියම් අයුරකින් සම්බන්ධයක් හෝ නොමැති බවට මම මෙයින් සහතික කර සිටිමි."

4. වේතනය.—අංක 14878/2 හා 1969 නොවැම්බර් මස 2 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි කළකරන ලද 1969 (අංක 1) නින්දගම් ඉඩම් රෙගුලාසිවලට ඇමිණූ දෙවැනි උප ලේඛනය අනුව යට දැක්වෙන පරිදි ගාස්තු ලැබීමට සාමාජික යින්ට හිමිකම් ඇත.

(i) පැය දෙකක කාල පරිච්ඡේදයක් ඉකුත් නොවන සෑම රැස්වීමකටම රු. 50 යි.

(ii) පැය දෙකක කාල පරිච්ඡේදයක් ඉකුත්වන සෑම රැස්වීමකටම රු. 75 යි.

5. 1970 මාර්තු මස 13 වැනි දින හෝ ඊට පෙර හෝ සභාන අත්සන් කරනු ලබන මා වෙත ලැබෙන සේ ඉල්ලුම්පත් එවිය යුතුය.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 පෙබරවාරි මස 12 දා,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12දී ය.

2–739—70.2.20 දින අංක 14,894 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1970

| මාසය | | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 | සිකුරාද | ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 | සිකුරාද | ... | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1.16 | සිකුරාද | ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 | සිකුරාද | ... | 70. 1.16 | සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 1.29 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 | බදාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 | සිකුරාද | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 70. 2.20 | සිකුරාද | ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 | සිකුරාද | ... | 70. 2.20 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 | සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 3.13 | සිකුරාද | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 | සිකුරාද | ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 | බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි